# ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

# ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ,
අංක **1316**, නෙළුම් මාවත,
ජයන්තිපුර,
බත්තරමුල්ල.

# ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

# ව්‍යවස්ථාව

## පළමු කොටස

### 1 වන වගන්තිය
### පක්ෂ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මූලික ප්‍රතිපත්තිය වන්නේ ශ්‍රී ලාංකික සමාජ සන්දර්භය හා සැසඳෙන සමාජ ප්‍රජාතන්ත්‍රවාදයකි. එම ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම පුරවැසි පරමාධිපත්‍යයයි. එම නිසා පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදී පදනමේ උත්තරීතරම තැනැත්තා පක්ෂ සාමාජිකයාය. 'බලය මහජනතාව සතුය' යන මූලධාර්මික පිළිගැනීම මත පක්ෂය විශ්වාසය තබන්නේ සර්ව ජන ඡන්දය මත පදනම් වූ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහිය. සමාජ අභිවෘද්ධිය, නිදහස, සමානාත්මතාව සහ පුද්ගල අයිතිවාසිකම් මත පදනම්ව සෑම පුද්ගලයෙකුටම හා පවුලකටම සශ්‍රීක, සෞභාග්‍යමත් සහ දැහැමි ජීවිතයක් ගොඩනගාදීම පක්ෂයේ අරමුණයි.

ඒකීය, ස්වෛරී ශ්‍රී ලංකාවක් යන්න පක්ෂයේ දේශපාලන පරමාදර්ශයයි. මේ රටේ මූලික ශිෂ්ටාචාර සංරචකයන් සුරක්ෂිත කිරීමේ වගකීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් කිසිදු විවාදයකින් තොරව භාරගනු ඇත. කිසිදු දේශීය හෝ විදේශීය බලවේගයකට ජාතික ආරක්ෂාවට හෝ ජාතික ආර්ථිකයට තර්ජනයක් එල්ල කිරීමට හෝ මව්බිම බෙදීමකට පක්ෂය ඉඩ නොතබයි. කවර සමාජ බෙදීමක් හෝ පදනම් කරගෙන මාතෘභූමිය විනාශය කරා රැගෙන යාමට කිසිවෙකුට අවස්ථාව නොසලසන බවට පක්ෂය සපථ කරයි. ඒ හා සමානවම මෙම භූමිය මත ජීවත්වන්නා වූ කිසිදු ජනවර්ගයක අයිතිවාසිකම් සහ අනන්‍යතාවන්ට එරෙහිව ක්‍රියාකිරීමට ද පක්ෂය කිසිවෙකුට ඉඩ නොතබයි. සෑම ජනවර්ගයකටම අනන්‍ය වන්නා වූ සංස්කෘතික උරුමයන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් පිළිගනු ලබන අතරම ඒවා ආරක්ෂාකර අවිච්ඡින්නව පවත්වාගෙන යාම පක්ෂයේ මූලික ප්‍රතිපත්තියක් ලෙස පිළිගනී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සනාථකර ඇති භාෂා, ආගමික සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පක්ෂය බැඳී සිටිනු ඇත.

පුරවැසියන්ගේ අභිලාෂයන් මුදුන්පත් කරගත හැකි තිරසාර ජාතික ආර්ථිකයක් ගොඩනැගීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආර්ථික ප්‍රතිපත්තියයි. ආර්ථික මර්මස්ථානවල රාජ්‍ය අංශයේ මැදිහත්වීම දුර්වල නොකළ යුතු බවත් ඒවා රටේ ආර්ථික ස්ථාවරත්වයේ දිගුකාලීන යහපත සඳහා කාර්යක්‍ෂම හා ඵලදායී ලෙස නවීකරණය කළ යුතු බව පක්ෂය පිළිගනී. එමෙන්ම පෞද්ගලික අංශය ද රටේ ආර්ථිකය ශක්තිමත් කරන මූලික ක්ෂේත්‍රයක් ලෙස පිළිගනු ලබයි. එම අංශයට නිදහසේ සහ පහසුවෙන් තම ආර්ථික ව්‍යාපාරවල යෙදීමට අවශ්‍ය පහසුකම් සැපයීම රජයේ වගකීමක් ලෙස පක්ෂය පිළිගනී. එමෙන්ම කුඩා සහ මධ්‍යම පරිමාණ සහ පොදුජන සමාගම් දිරිගන්වනු ලැබේ. සමූපකාර ක්ෂේත්‍රය තරඟකාරී ලෙස ජාතික ආර්ථිකයට මැදිහත්විය යුතු බව පක්ෂයේ පිළිගැනීමයි. සම්ප්‍රදායික සහ පාරම්පරික ආර්ථික ක්‍රමවේදයන් ආරක්ෂාකර ගනිමින් සහ වැඩි දියුණු කරමින් දැනුම සහ තොරතුරු පදනම් කරගත් තාක්ෂණය සහ ශිල්ප ක්‍රම ඇතුළත් නවීන ගෝලීය ප්‍රවනතා සමඟ ද උපාය මාර්ගික හුවමාරුවේ අවශ්‍යතාව පක්ෂය පිළිගනී; ක්‍රියාත්මක කරයි. ස්වභාවික උරුමයන් ලෙස අපට දායාද වී ඇති සශ්‍රීක පොළව, පිරිසිදු ජලය, ගහ කොළ සිප හමන වාතාශ්‍රය, කිසිදු ප්‍රතිලාභයක් උදෙසා කැප කිරීමෙන් තොරව මතු පරපුරේ ද අයිතිවාසිකම් වෙනුවෙන් ආරක්ෂා කිරීමට පක්ෂය බැඳී සිටී. තවද ගෝලීය ප්‍රවණතා මුල්කරගත් ආර්ථික ක්‍රියාවලියේ ජීවනාලිය බවට පත්වන්නේ නිර්මාණශීලී සහ නවෝත්පාදනය පදනම් කරගත් තාරුණ්‍යයයි. සමාජ බේදීම් වලින් තොරව රටේ සියලු පුරවැසියන්ට එක සමානව එකී ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ සහ වරප්‍රසාද හිමිවන පරිදි ක්‍රියාකිරීම පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තියයි.

ආගමික සහ ජනවාර්ගික අන්තවාදය පිටුදැකීම, ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව, සමාජ සාමකාමීත්වය, වෙනස්කොට නොසැලකීම සහ මහජන සාමය ආරක්ෂා කිරීමත් සෑම තරාතිරමකම පුරවැසියෙකුටම හිරහැර සහ හිංසනයන්ගෙන් තොර සුරක්ෂිත සමාජ පරිසරයක් ගොඩනැගීමත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සමාජ ප්‍රතිපත්තියයි.

## 2 වන වගන්තිය
### ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි අනන්‍යතාව

(අ) පක්ෂයේ නම "ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ" වන්නේය.

(ආ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මැතිවරණ සලකුණ "මල් පොහොට්ටුව" ය. (ඇමුණුම අංක 01)

(ඇ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට වෙනම ම ධජයක්/ පතාකයක් ඇත්තේය. (ඇමුණුම අංක 02)

(ඈ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ගීතය,

"ඉරෙන් සඳවත එළි දැල්වේ - සඳෙන් රැය සඳුර නිමවේ
ඔබෙන් පෙරමුණ එළි දැල්වේ - එයින් ජන සඳුර නිමවේ ......"
වශයෙන් වන්නේය.

(සම්පූර්ණ ගීතය ඇමුණුම අංක 03)

(ඉ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ලිපිනය අංක 1316, නෙළුම් මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල වන අතර එය අවශ්‍යතාවය පරිදි වෙනස් කළ හැක.

## 3 වන වගන්තිය
### පක්ෂ සාමාජිකත්වය

(අ) පක්‍ෂ සාමාජිකයා

i. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි පරමාධිපත්‍යය සාමාජිකයා කෙරෙහි පිහිටා ඇත්තේය.
ii. සෑම සාමාජිකයෙකුටම පක්ෂයේ ශාඛා සමිතියේ සිට ඉහළම මණ්ඩල දක්වා ඕනෑම තනතුරකට තේරී පත්වීමට අයිතිය ඇත්තේය.
iii. සෑම සාමාජිකයෙකුට පක්ෂය තුළ තම මතය ප්‍රකාශ කිරීමටත් පක්ෂය පිළිබඳ තොරතුරු දැනගැනීමටත් අයිතිය ඇත්තේය.
iv. සෑම සාමාජිකයෙකුටම එක සමාන සැළකුම් හා පිළිගැනීම් ලැබීමට අයිතිය ඇත්තේය.

(ආ) **පක්ෂයේ සාමාජිකත්වය ලබාගැනීම**

i. පක්ෂයේ ව්‍යවස්ථාව සහ ප්‍රතිපත්ති පිළිගන්නා වයස අවුරුදු 16 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුටම පක්‍ෂ සාමාජිකත්ව අයදුම්පත පුරවා වාර්ෂික සාමාජික ගාස්තුව වන රුපියල් විස්ස (20/=) ක මුදලක් හෝ තත්කාලීනව බලපැවැත්වෙන සාමාජික ගාස්තුව ගෙවීමෙන් පක්ෂ සාමාජිකත්වය අයදුම් කළ හැක්කේය.

ii. පක්ෂයේ නායක/ සභාපති සහ මහ ලේකම්වරයාගේ අත්සනින් යුත් සාමාජික කාඩ්පතක් නිකුත් කිරීමෙන් එම සාමාජිකත්වය තහවුරු වන්නේය. නියම කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් ඉලෙක්ට්‍රෝණික කාඩ්පතක් සාමාජිකයාට ලබාගත හැකිය.

iii. සාමාජිකත්ව වර්ෂය ලෙස සළකනු ලබන්නේ කිසියම් වර්ෂයක ජනවාරි 01 දා සිට දෙසැම්බර් 31 දක්වා කාල පරාසයයි. සෑම වර්ෂයකම ඔක්තෝම්බර් මස 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ඉදිරි වර්ෂය සඳහා නියමිත සාමාජික මුදල ගෙවා සාමාජිකත්වය අලුත් කළ යුතුය.

iv. දේශපාලන මණ්ඩලය විසින් විටින් විට තීරණය කරනු ලබන නිශ්චිත මුදලක් ගෙවීමෙන් කිසියම් අයෙකුට පක්ෂයේ යාවජීව සාමාජිකත්වය ලබාගැනීමට හැකියාව ඇත්තේය.

v. එක් එක් විදේශ ශාඛාවල සාමාජික ගාස්තුව හෝ එහි සංශෝධන සඳහා පක්ෂයේ විධායක සභාවේ අනුමැතියට යටත්ව එකී විදේශීය ශාඛාවේ මහසභා රැස්වීමකදී තීරණය කළ යුතු අතර එම තීරණය ක්‍රියාත්මක කිරීමට පෙර පක්ෂයේ මහ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

(ඇ) **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සාමාජිකත්වය ලබාගන්නා ඕනෑම තැනැත්තෙකු පක්ෂයේ ප්‍රතිපත්ති, මූලධර්ම හා ආචාර ධර්මතා පද්ධතිය පිළිගැනීමට බැඳී සිටින අතර ඊට එකඟව කටයුතු කළ යුත්තේය.**

(ඈ) **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කවර හෝ සාමාජිකයෙක් වෙනත් පක්ෂයක හෝ සන්ධානයක සාමාජිකත්වය ලබාගන්නේ නම් ඔහුගේ හෝ ඇයගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි වන්නේය.**

## 4 වන වගන්තිය
### සංවිධාන ව්‍යුහය

(අ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සංවිධාන ව්‍යුහය පහත දැක්වෙන්නේය.

i. ශාඛා සමිතිය
ii. ආසන බල මණ්ඩලය
iii. ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණ
iv. ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණ
v. සමස්ත ලංකා කාරක සභාව
vi. විධායක සභාව
vii. දේශපාලන මණ්ඩලය
viii. පක්ෂ මහ සම්මේලනය

(ආ) වෘත්තීය සංවිධාන

i. ශ්‍රී ලංකා පොදුජන ප්‍රගතිශීලී සේවක සංගමය
ii. ප්‍රගතිශීලී රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනය
iii. ශ්‍රී ලංකා පොදුජන අධ්‍යාපන සේවක සංගමය
iv. ශ්‍රී ලංකා පොදුජන ප්‍රවාහන සේවක සමිතිය
v. ශ්‍රී ලංකා පොදුජන වතු සේවක සංගමය
vi. ප්‍රගතිශීලී පළාත් පාලන සේවක සංගමය
vii. ශ්‍රී ලංකා පොදුජන පෞද්ගලික ආයතන සේවක සංගමය

(ඇ) අනුබද්ධ සංවිධාන

**විශේෂිත සමූහයන්ට හෝ වෘත්තීය කණ්ඩායම්වලට දේශපාලන මණ්ඩලයේ අනුමැතිය මත පක්ෂයේ අනුබද්ධ සංවිධානයක් ලෙස ලියාපදිංචි වීමට අවස්ථාව ලබාදෙන අතර එම සංවිධාන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි අනුබද්ධ සංවිධාන ලෙස පිළිගනු ලැබේ.**

(ඈ) පක්ෂයේ මණ්ඩල

i. බුද්ධි මණ්ඩලය
ii. විනය මණ්ඩලය
iii. බේරුම්කාර මණ්ඩලය
iv. නාම යෝජනා මණ්ඩලය
v. දේපොළ හා මුදල් භාරකාර මණ්ඩලය
vi. ප්‍රවර්ධන සහ ප්‍රචාරණ මණ්ඩලය

## 5 වන වගන්තිය
### ශාඛා සමිති

(අ) ශාඛා සමිති පිහිටුවීම.

i. සෑම ග්‍රාමසේවා වසමකට අවම වශයෙන් එක් ශාඛා සමිතියක් පිහිටුවීම යෝග්‍ය වන්නේය.
ii. අවශ්‍ය අවස්ථාවන්හිදී සහ අදාළ ප්‍රදේශයන්හි ග්‍රාමසේවා වසමේ විශාලත්වය, ජනගහණයේ හෝ වෙනයම් භෞතික බේදීමක් මුල් කරගෙන එක් ග්‍රාමසේවා වසමක එකට වඩා වැඩි ශාඛා සමිති සංඛ්‍යාවක් පිහිටුවීමට ආසන බල මණ්ඩලයට හැකියාව ඇත්තේය.
iii. දේශපාලන මණ්ඩලයේ අනුමැතිය සහිතව විවිධ ආයතන සහ විවිධ ක්ෂේත්‍රවලට ද විශේෂ ශාඛා සමිති පිහිටුවිය හැක්කේය.
iv. දේශපාලන මණ්ඩලයේ අනුමැතිය සහිතව ශ්‍රී ලංකාවෙන් බැහැරව විදේශ රටවල ජීවත්වන අය වෙනුවෙන් පක්ෂයේ විදේශ ශාඛා සමිති පිහිටුවීමට හැක්කේය.
v. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඉහත සඳහන් කවර හෝ ශාඛා සමිතියක් පිහිටුවීම සඳහා අවම සාමාජික සංඛ්‍යාව විස්සක් (20)විය යුතුය.

(ආ) ශාඛා සමිතියේ නිලධාරී මණ්ඩලය

i. අනුශාසකවරු (අවශ්‍යතාව පරිදි අනුශාසකවරුන් පත්කරගත හැකිය)
ii. සභාපති
iii. ලේකම්
iv. භාණ්ඩාගාරික
v. උප සභාපතිවරු හතර (04) දෙනෙකු

(එක් උප සභාපති ධූරයක් සඳහා කාන්තාවක් සහ තවත් උප සභාපති ධූරයක් සඳහා වයස අවුරුදු 35 ට අඩු තරුණ අයෙකු තෝරා පත් කරගත යුතුය)

vi. උප ලේකම්වරු හතර (04) දෙනෙකු

(එක් උප ලේකම් ධූරයක් සඳහා කාන්තාවක් සහ තවත් උප ලේකම් ධූරයක් සඳහා වයස අවුරුදු 35 ට අඩු තරුණ අයෙකු තෝරාපත් කරගත යුතුය)

vii. කාරක සභාව (ශාඛා සමිතියක කාරක සභාවේ සාමාජිකයන් ගණන අවම වශයෙන් හය (06) දෙනෙකුට නොඅඩු විය යුතුය.)

(ඇ) ශාඛා සමිතියේ මහසභා රැස්වීමේදී නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගත යුත්තේය.

(ඈ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශාඛා සමිතිවල නිල කාලය වසර දෙකකි.

(ඉ) ශාඛා සමිතිවල වගකීම සහ කාර්ය භාරය.

i. අදාළ ශාඛාව විසින් නියෝජනය කරන ගම, අදාළ ආයතනය හෝ විදේශ රටවල වෙසෙන පක්ෂ සාමාජිකයින්ගේ මෙන්ම පක්ෂයේ ප්‍රවර්ධනය, සුභ සිද්ධිය හා අභිවෘද්ධිය වෙනුවෙන් උපරිම විශ්වාසයෙන්, කැපවීමෙන් හා අවංකව කටයුතු කළ යුත්තේය.

ii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ආසන, දිස්ත්‍රික් හෝ ජාතික වැඩසටහන් සඳහා සාමාජික සහභාගීවත්ය ලබාදීම, මැතිවරණ කටයුතු සඳහා සාමාජිකයින්ගේ සක්‍රීය සහ උපරිම දායකත්වය ලබාදීම ශාඛා සමිතිවල යුතුකම හා වගකීම වේ.

iii. පක්ෂයේ බිම් මට්ටමේ සිට සාමාජිකයාගේ මතය පක්ෂයේ ඉහළට ගෙනයාමේ ආරම්භක යාන්ත්‍රණය විය යුත්තේ ශාඛා සමිතිය වේ. රටේ ජනතාවගේ සහ පක්ෂයේ අභිවෘද්ධිය සඳහා වන එවැනි යෝජනා පළමුව ශාඛා සමිතියට ඉදිරිපත්කර එහි අනුමැතිය සහිතව ආසන බල මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

iv. සෑම ශාඛා සමිතියකම සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික නිල බලයෙන් ආසන බල මණ්ඩලය නියෝජනය කළ යුතුය.

v. ඊට අමතරව ශාඛා සමිතියේ සාමාජික සංඛ්‍යාව විස්සට (20) වඩා වැඩිවන අවස්ථාවකදී එසේ වැඩිවන දහයට එකේ අනුපාතයට ආසන බල මණ්ඩලය නියෝජනය කිරීමට ශාඛා සමිතිවලට අවස්ථාව ඇත්තේය. ඒ සඳහා තෝරාගන්නා නියෝජිතයන් ශාඛා සමිතියේ බහුතර කැමැත්තෙන් තෝරාගත යුත්තේය.

## 6 වන වගන්තිය

### ආසන බල මණ්ඩලය

(අ) සෑම මැතිවරණ ආසන බල ප්‍රදේශයකටම එක් ආසන බල මණ්ඩලයක් පිහිටුවිය යුක්තේය.

(ආ) ආසන බලමණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම් ලබන්නේය.

i. ආසන බල ප්‍රදේශය තුළ පිහිටුවා ඇති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සියලුම ශාඛා සමිතිවල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ අවශ්‍ය අවස්ථාවන්හිදී දහයට එකේ අනුපාතය යටතේ නම්කරනු ලබන සාමාජිකයන්

ii. ආසන බල ප්‍රදේශය තුළ දේශපාලනයේ යෙදෙන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සාමාජිකත්වය දරන සියලුම පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන නියෝජිතයින් (නිල බලයෙන්)

iii. ආසන බල ප්‍රදේශය තුළ පදිංචි පක්ෂයේ සමස්ත ලංකා කාරක සභාවේ සාමාජිකයන්

iv. ආසනය තුළ පිහිටුවා ඇති ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණෙහි කාන්තා සංවිධානවල සහ ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණෙහි තරුණ සංවිධානවල සභාපති සහ ලේකම්

v. මෙම ව්‍යවස්ථාවේ සඳහන් අනුබද්ධ සංවිධාන අතරින් නියෝජනය ලැබීම සඳහා සුදුසුකම් ලබන අනුබද්ධ සංවිධානවල ආසන සංවිධාන තිබේ නම් ඒවායේ සභාපති, ලේකම් ඇතුලුව එක් සංවිධානයකින් විස්සකට (20) නොවැඩි පිරිසක්.

(ඇ) ආසන බලමණ්ඩලයේ නිලධාරී මණ්ඩලය මහසභා රැස්වීමකදී තෝරා ගන්නා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වන්නේය.

i. අනුශාසකවරු
ii. සභාපති
iii. ලේකම්
iv. භාණ්ඩාගාරික
v. නියෝජ්‍ය සභාපතිවරු
vi. උප සභාපතිවරු හතර (04) දෙනෙකු
(උප සභාපතිවරු අතරින් එක් ධූරයක් සඳහා කාන්තාවක් සහ තවත් ධූරයක් සඳහා වයස අවුරුදු 35ට අඩු තරුණ අයෙකු පත් කරගත යුතුය)
vii. උප ලේකම්වරු හතර (04) දෙනෙකු සහ
(උප ලේකම්වරු අතරින් එක් ධූරයක් කාන්තාවක් සහ තවත් ධූරයක් සඳහා වයස අවුරුදු 35ට අඩු තරුණ අයෙකු පත් කරගත යුතුය)
viii. කාරක සභිකයින් දහ (10) දෙනෙකු

(ඇ) ආසන බලමණ්ඩලයේ සභාපතිවරයා මහසභා රැස්වීමකදී බහුතර කැමැත්තෙන් පත්කර ගත යුත්තේය. ආසන බලමණ්ඩලයේ සභාපතිවරයා නිල බලයෙන් ආසන සංවිධායකවරයා බවට පත්වන්නේය. කෙසේවුවද අදාළ ආසනය තුල පක්ෂයේ අභිවෘද්ධිය වෙනුවෙන් බල මණ්ඩලයේ සභාපතිවරයා නොවන පුද්ගලයෙකු පත්කළ යුතු බවට පක්ෂ නායකයාගේ මතය වන අවස්ථාවකදී සුදුසු ආසන සංවිධායකවරයෙකු පත්කිරීමේ බලය පක්ෂ නායකයා සතු වන්නේය.

(ඉ) අදාළ ආසන බලමණ්ඩල ප්‍රදේශය තුළ දේශපාලනයේ යෙදෙන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් මෙන්ම පළාත් පාලන ආයතන ප්‍රධානීන් සහ පළාත් පාලන ආයතන කණ්ඩායම් නායකයින් නිල බලයෙන් ආසන බලමණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරු ලෙස පත්විය යුතු වන්නේය.

(ඊ) ආසන බලමණ්ඩලවල වගකීම සහ කාර්ය භාරය.

i. පක්ෂයේ උන්තිය සහ වර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණයට අදාළ සියලුම කාර්යයන් ආසන බල ප්‍රදේශය තුළ ඉටු කිරීම ආසන බලමණ්ඩලයේ ප්‍රධාන වගකීම වන්නේය. ඊට අමතරව පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් පවරනු ලබන කාර්යයන් ආසන බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමද ආසන බලමණ්ඩලයේ වගකීම වන්නේය.

ii. ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා මැතිවරණ, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් හෝ වෙනත් කවර මැතිවරණයක දී වුවද ආසනය තුළ පක්ෂය ඉහළින්ම ජයග්‍රහණය කරවීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේ ආසන බලමණ්ඩලයටය.

iii. අවශ්‍ය අවස්ථාවලදී පක්ෂය සමඟ සන්ධානගත වී ඇති අනෙකුත් දේශපාලන පක්ෂ සහ සංවිධාන සමඟ සහයෝගයෙන් වැඩ කටයුතු කිරීම ආසන බලමණ්ඩලයේ වගකීමක් වන්නේය.

iv. පක්ෂයේ මහ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව, පක්ෂය සමඟ සන්ධානගත වී නොමැති එසේ නමුත් පක්ෂයේ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් සමඟ සමගාමීව කටයුතු කරන, පිළිගත් දේශපාලන පක්ෂ නොවන පක්ෂ සහ වෙනත් සංවිධාන සමඟ තම බලප්‍රදේශය තුළ සහයෝගීත්වයෙන් යුතුව කටයුතු කිරීමට ආසන බලමණ්ඩලට බාධාවක් නැත්තේය.

v. තම බලප්‍රදේශය තුළ පිහිටා ඇති පක්ෂයේ ශාඛා සමිතිවල ක්‍රියාකාරීත්වය, මනා පරිපාලනය සහ මූල්‍ය පිළිබඳ අධීක්ෂණය උපදෙස්දීම ද ආසන බලමණ්ඩලයේ වගකීම වන්නේය.

vi. පක්ෂයේ උන්නතිය සඳහා පක්ෂ සාමාජිකයින් විසින් ශාඛා සමිති මට්ටමින් ඉදිරිපත් කරනු ලබන යෝජනා අතරින් වන වඩාත් සුදුසු යැයි හැඟෙන යෝජනා විධායක සභාවට ඉදිරිපත් කිරීම ආසන බල මණ්ඩලයේ වගකීමකි.

vii. පක්ෂයේ මහ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව බැංකු ගිණුම් පවත්වාගෙන යාමට ආසන බලමණ්ඩලයට අයිතිය තිබෙන අතර වාර්ෂිකව අයවැය සභා සම්මත කර එහි සහතික පිටපතක් පක්ෂයේ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

viii. ආසන බලමණ්ඩලයේ යෝජනා සම්මතයකින් පසුව පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අනුමැතිය සහිතව අදාල ආසනයේ පක්ෂයේ කටයුතු සඳහා ප්‍රතිපාදන රැස්කිරීමේ බලය ආසන බලමණ්ඩලය සතු වන්නේය.

ix. ආසන බල මණ්ඩලයේ ලේකම්වරයා විසින් අදාල ආසනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව වාර්ෂික වාර්තාවක් පක්ෂයේ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුත්තේය.

x. ආසන බල මණ්ඩලයේ රැස්වීම් අවම වශයෙන් මාස හයකට (06) වරක්වත් පැවැත්වීම යෝග්‍ය වන්නේය.

(උ) ආසන බල මණ්ඩල ක්‍රියාකාරී කමිටුව.

i. ආසන බල මණ්ඩලයේ සභාපතිවරයා සහ නිලධාරී මණ්ඩලය

ii. ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණෙහි සහ ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණෙහි ආසන බල මණ්ඩල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරිකවරු

iii. අනුබද්ධ සංවිධානවල ආසන බල මණ්ඩලවල සභාපති සහ ලේකම්වරු

iv. ආසන බල මණ්ඩලයේ සංවිධායකවරයා ක්‍රියාකාරී කමිටුවේ ද සභාපතිවරයා වන්නේය.

v. ආසන බලමණ්ඩලය විසින් ගන්නා තීරණ ක්‍රියාවට නැංවීම, බල මණ්ඩලයේ එදිනෙදා ක්‍රියාකාරීත්වය පවත්වාගෙනයාම, දේශපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයවීමේ බලය මෙම කමිටුවේ කාර්ය භාරය වන්නේය.

vi. ක්‍රියාකාරී කමිටුවේ රැස්වීම් මාස තුනකට (03) වරක් පැවැත්වීම යෝග්‍ය වන්නේය.

## 7 වන වගන්තිය

### ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණ

(අ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සාමාජිකත්වය ලබාගන්නා සෑම කාන්තාවකටම ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණේ සමාජිකත්වය ලැබීමේ අයිතිය ඇත්තේය.

(ආ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ශාඛා සමිතියක කාන්තා සාමාජික සංඛ්‍යාව විස්සකට (20) වැඩිවන සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කාන්තා සංවිධානයක් පිහිටුවා ගැනීමට අයිතිය ඇත්තේය.

(ඇ) එසේ පිහිටුවා ගන්නා ශ්‍රී ලංකා පොදුජන කාන්තා සංවිධානවලට ද පක්ෂ සාමාජිකත්වය ලබාදීමට බලය ඇත්තේය.

(ඈ) ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණේ සෑම කාන්තා සංවිධානයකම සභාපති සහ ලේකම් හට නිල බලයෙන් පක්ෂයේ ආසන බල මණ්ඩලයේ සාමාජිකත්වය හිමිවේ.

(ඉ) ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණට වෙනම ව්‍යවස්ථාවක් තිබිය හැකි අතර එම ව්‍යවස්ථාව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලය විසින් අනුමත විය යුතු අතර පක්ෂ ව්‍යවස්ථාවට යටත් විය යුත්තේය.

## 8 වන වගන්තිය

### ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණ

(අ) වයස අවුරුදු දහසයට (16) ට වැඩි අවුරුදු තිස්පහට (35) අඩු පක්ෂයේ සාමාජිකයින්ට ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණේ ද සමාජිකත්වය ලැබීමට අයිතිය ඇත්තේය.

(ආ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ශාඛාවක තරුණ සාමාජිකයින්ගේ සංඛ්‍යාව විස්සට (20) ට වඩා වැඩිවන සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණේ ශාඛාවක් පිහිටුවා ගැනීමට අයිතිය ඇත්තේය.

(ඇ) ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණේ ශාඛාවන්ටද පක්ෂ සාමාජිකයින් බඳවා ගැනීමට හැකියාව ඇත්තේය.

(ඈ) ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණේ සෑම ශාඛාවකම සභාපති සහ ලේකම් නිල බලයෙන් පක්ෂයේ ආසන බල මණ්ඩලයේ සාමාජිකයෝ වෙති.

(ඉ) ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණට වෙනම ව්‍යවස්ථාවක් තිබිය හැකි අතර එම ව්‍යවස්ථාව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලය විසින් අනුමත විය යුත්තා සේම පක්ෂයේ ව්‍යවස්ථාවට යටත් විය යුත්තේය.

## 9 වන වගන්තිය

### සමස්ත ලංකා කාරක සභාව

(අ) සමස්ත ලංකා කාරක සභාව පහත සඳහන් පරිදි ස්ථාපිත වන්නේය.

i. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්

ii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්

iii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්, උප ප්‍රධානීන්, විපක්ෂ නායකයින් හෝ කණ්ඩායම් නායකයින්

iv. සියලුම ආසන බලමණ්ඩලවල සභාපතිවරු සහ ලේකම්වරු. සුවිශේෂී අවස්ථාවලදී ඉහත සාමාජිකයන්ට අමතරව හෝ ඒ වෙනුවට වෙනත් සාමාජිකයෙක් නම් කිරීමට පක්ෂ නායකයාට බලය ඇත්තේය.

v. ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණ මඟින් නම් කරනු ලබන සාමාජිකාවන් පනස් (50) දෙනෙක්

vi. ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණ මඟින් නම් කරනු ලබන සාමාජිකයින් පනස් (50) දෙනෙක්

vii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ වෘත්තීය සම්මේලන හයෙන් (06) එක් සම්මේලනයකින් සාමාජිකයින් විසි (20) දෙනා බැගින්

viii. මෙම ව්‍යවස්ථාවේ 16 (ඊ) i ,ii , iii, වගන්තිවලට අනුව සුදුසුකම් ලබන්නා වූ එක් එක් අනුබද්ධ සංවිධාන වලින් තෝරා එවනු ලබන සාමාජිකයින් දස (10) දෙනෙකු

ix. ඉහත අංශවලින් නියෝජනයක් නොලබන සාමාජිකයින් අතරින් පක්ෂ නායකයා විසින් නම්කර එවනු ලබන පනස් (50) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් සමස්ත ලංකා කාරක සභාවේ සාමාජිකයෝ වෙති.

(ආ) සමස්ත ලංකා කාරක සභාවේ බලතල සහ කාර්ය භාරය

i. පක්ෂ නායකයා සමස්ත ලංකා කාරක සභාවේ ප්‍රධානියා වන්නේය.

ii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විධායක සභාව තෝරා පත්කළ යුතු වන්නේ සමස්ත ලංකා කාරක සභාව විසිනි.

iii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දියුණුවට හා සාමාජිකයින්ගේ යහපතට හේතුවන ඉදිරි සැළසුම් යෝජනා ඉදිරිපත් කොට සම්මත කිරීමට සමස්ත ලංකා කාරක සභාවට බලය ඇත්තේය.

iv. සමස්ත ලංකා කාරක සභාවේ අනුමැතිය ලබාගත යුතුයැයි පක්ෂ නායකයා හෝ දේශපාලන මණ්ඩලය තීරණය කරන යම් කරුණක් සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමට මෙම සභාවට බලය තිබේ.

v. සමස්ත ලංකා කාරක සභාව පැවැත්වීම සඳහා වන සණ පූර්ණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් දහයෙන් එකක් (1/10) විය යුත්තේය.

vi. සමස්ත ලංකා කාරක සභාව යටත් පිරිසයින් මාස හයකට (06) වරක්වත් රැස්වීම යෝග්‍ය වන්නේය.

vii. පක්ෂ නායකයා විසින් අවශ්‍යයැයි තීරණය කරන ඕනෑම අවස්ථාවක සමස්ත ලංකා කාරක සභාව කැඳවීමට පක්ෂ මහ ලේකම්වරයා බැඳී සිටින්නේය.

## 10 වන වගන්තිය

### විධායක සභාව

(අ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විධායක සභාව පහත සඳහන් පරිදි වන්නේය.

i. පක්ෂයේ නායකයා සහ නිලධාරී මණ්ඩලය විධායක සභාවේ සාමාජිකයින් වන අතර පක්ෂ නායකයා එහි ප්‍රධානියා ද වන්නේය.

ii. පක්ෂයේ සාමාජිකත්වය දරන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන්

iii. ආසන බලමණ්ඩලවල සභාපතිවරු/ සභාපතිවරියන් හෝ ආසන බලමණ්ඩල පත්කර නොමැති අවස්ථාවලදී ඒ වෙනුවට පත්කර ඇති කැඳවුම්කරුවන්

iv. සමස්ත ලංකා කාරක සභාව නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරු හෝ කිසියම් හෝ සියලුම පළාත් සභා විසුරුවා හැර අවස්ථාවකදී නැවත පළාත් සභාව තෝරා පත්කර ගන්නා තුරු පැවති පළාත් සභා නියෝජිතයන් අතරින්

පළාත් සභා මන්ත්‍රී සංසදය විසින් තෝරා එවනු ලබන නියෝජිතයන් තිස් (30) දෙනෙකු

v. සමස්ත ලංකා කාරක සභාව නියෝජනය කරන පළාත් පාලන ආයතන ප්‍රධානීන් අතරින් පළාත් පාලන මන්ත්‍රී සංසදය විසින් තෝරා එවනු ලබන නියෝජිතයන් හැට (60) දෙනෙකු

vi. සමස්ත ලංකා කාරක සභාව නියෝජනය කරන ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණෙහි සහ ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණෙහි සාමාජිකයින් අතරින් එම පෙරමුණු විසින් තෝරා එවනු ලබන සාමාජිකයින් පස් (05) දෙනෙකු බැගින්

vii. සමස්ත ලංකා කාරක සභාව නියෝජනය කරන වෘත්තීය සම්මේලන සාමාජිකයින් අතරින් එක් සම්මේලනයකින් දෙදෙනෙකු (02) බැගින්

viii. සමස්ත ලංකා කාරක සභාව නියෝජනය කරන අනුබද්ධ සංවිධාන නියෝජිතයින් අතරින් එක් සංවිධානයකින් දෙදෙනෙකු (02) බැගින්

ix. සමස්ත ලංකා කාරක සභාව නියෝජනය කරන සාමාජිකයින් අතරින් පක්ෂ නායකයා විසින් නම් කරනු ලබන තිස් දෙනෙකු (30) ට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් ද, වශයෙන් විය යුතුය.

(ආ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විධායක සභාවේ නිලධාරී මණ්ඩලය.

i. පක්ෂ නායකයා
ii. පක්ෂ සභාපති
iii. පක්ෂ මහ ලේකම්
iv. භාණ්ඩාගාරික
v. ජාතික සංවිධායක
vi. **ජාතික කැඳවුම්කරු**
vii. නියෝජ්‍ය ජාතික සංවිධායක (01)
viii. නියෝජ්‍ය ජාතික සංවිධායක (02)

යන නිලධාරීන් විධායක සභාවේ නිලධාරී මණ්ඩලය වන්නේය.

(ඇ) නියෝජ්‍ය ජාතික සංවිධායකවරුන් දෙදෙනා දමිළ සහ මුස්ලිම් ජනවර්ගයන් නියෝජනය කිරීම සඳහා පත්කිරීම යෝග්‍ය වන්නේය.

(ඈ) විධායක සභාවේ නිලධාරී මණ්ඩලය පක්ෂයේ නිලධාරී මණ්ඩලය ද වන්නේය.

(ඉ) විධායක සභාවේ බලතල සහ කාර්ය භාරය.

i. පක්ෂ නායකයා හැර නිලධාරී මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් තෝරාපත් කළ යුතු වන්නේ විධායක සභාව විසිනි.

ii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සාමාජිකයින්ගේ යහපතට හා පක්ෂයේ දියුණුවට හේතුවන ඉදිරි සැළසුම් සහ යෝජනා ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇත්තේ විධායක සභාවටය.

iii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විනය මණ්ඩලය, බේරුම්කාර මණ්ඩලය සහ ප්‍රවර්ධන සහ ප්‍රචාරණ මණ්ඩල සඳහා සාමාජිකයන් පත්කළ යුත්තේ විධායක සභාව විසිනි.

iv. විධායක සභාව පැවැත්වීම සඳහා සණ පූර්ණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් දහයෙන් එකක් (1/10) විය යුත්තේය.

v. විධායක සභාව යටත් පිරිසෙයින් වර්ෂයකට දෙවරක්වත් රැස්වීම යෝග්‍ය වන්නේය.

## 11 වන වගන්තිය
### පක්ෂ නායකයා

(අ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකයා පක්ෂයේ බහුතර සාමාජිකයින්ගේ කැමැත්ත සහිත රටේ ඒකීයභාවය, සමෘද්ධිය, සංවර්ධනය, ජාතික සමගිය සහ ආරක්ෂාව සඳහා කැපවන සහ රටේ ජනතාවගේත් පක්ෂ සාමාජිකයින්ගේත් අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන පක්ෂයේ අවංක සාමාජිකයෙකු විය යුත්තේය.

(ආ) පක්ෂ නායකයා පත්කළ යුතු වන්නේ දේශපාලන මණ්ඩලයේ යෝජනා සම්මතයෙන් සහ මහ සම්මේලනයේ අනුමැතියෙනි.

(ඇ) පක්ෂ නායකයාගේ කාර්ය භාරය සහ බලතල.

i. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි නායකයා පක්ෂයේ ප්‍රධානියා සහ ප්‍රධාන විධායකයා වන්නේය.

ii. පක්ෂ නායකයා පක්ෂයේ උන්නතිය, ප්‍රවර්ධනය සහ පක්ෂය වෙත ජනමතය දිනාගැනීම සඳහා නිබඳව කැප වී ක්‍රියාකළ යුතුය.

iii. පක්ෂ නායකයා පක්ෂයේ මෙන්ම රටේත් පොදුජනයාගේත් සංවර්ධනය, සමෘද්ධිය සහ යහපත උදෙසා වන දේශපාලන වැඩපිළිවෙළවල් යෝජනා කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කැපවිය යුතුය.

iv. පක්ෂයේ ජාත්‍යන්තර කටයුතු, ජාත්‍යන්තර සංවිධාන සහ රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා පිළිබඳ වගකීම පැවරෙන්නේ ද පක්ෂ නායකයාටය.

v. පක්ෂ නායකයා පක්ෂ මහ සම්මේලනයේ, දේශපාලන මණ්ඩලයේ විධායක සභාවේ සහ සමස්ත ලංකා කාරක සභාවේ ප්‍රධානියා වන අතර සෑම විටම එකී රැස්වීම්වල මුලසුන දැරිය යුත්තේය. ඊට අමතරව ඕනෑම පක්ෂ මණ්ඩලයක හෝ පක්ෂ සංවිධානයක රැස්වීම්වලට සහභාගීවීමට සහ මුලසුන දැරීමට පක්ෂ නායකයා බලය ඇත්තේය.

vi. ඕනෑම අයෙකුට පක්ෂ සාමාජිකත්වය පිරිනැමීමට පක්ෂ නායකයාට බලය ඇත්තේය.

vii. පක්ෂ නායකයා සෑම විටම පක්ෂයේ බහුතර සමාජිකයින්ගේ අභිමතය වෙනුවෙන් පෙනීසිටිය යුතු අතර ඒ සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගැනීමේ බලය පක්ෂ නායකයා සතුය.

viii. පක්ෂය වඩා ශක්තිමත් කිරීම සඳහා පක්ෂ නායකයාට අවශ්‍යයැයි සිතන ඕනෑම අවස්ථාවක පක්ෂයේ ශාඛා සමිති මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ග්‍රාමීය සංවිධායකවරුන්, සංවිධායකවරුන්, සම සංවිධායකවරුන්, දිස්ත්‍රික් නායකයින්, සම්බන්ධීකාරකවරුන් හෝ විශේෂ නියෝජිතයින් පත් කිරීමට බලය ඇත්තේය.

ix. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සමස්ත ලංකා කාරක සභාව, විධායක සභාව හෝ දේශපාලන මණ්ඩලය ඇතුලු මෙම ව්‍යවස්ථාවෙහි දක්වෙන කවර සංවිධානයක් හෝ ඒවායේ කවර නිලධාරියෙකු හෝ අවශ්‍ය යැයි තීරණය කරන කවර හෝ අවස්ථාවක කැඳවීමට සහ කරුණු විමසීමට පක්ෂ නායකයාට බලය ඇත්තේය.

x. **පක්ෂයේ මහ ලේකම් ධූරය, ජාතික සංවිධායක ධූරය සහ ජාතික කැඳවුම්කරු ධූරය සඳහා සුදුස්සන්ගේ නම් විධායක සභාවට යෝජනා කිරීමේ බලය පක්ෂ නායකයා සතුය.**

xi. **කවර හෝ හේතුවක් මත පක්ෂයේ මහ ලේකම් ධූරය හිස්වන ඕනෑම අවස්ථාවකදී වැඩබලන මහ ලේකම්වරයෙකු පත්කිරීමේ බලය පක්ෂ නායකයා සතුය.**

xii. පක්ෂයේ ආසන සංවිධායකවරුන් පත්කිරීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ බලය ඇත්තේ පක්ෂ නායකයාටය.

xiii. පක්ෂයේ කිසියම් අර්බුධකාරීත්වයක් සමනය කිරීම සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගැනීමේ බලය සම්පූර්ණයෙන්ම පක්ෂ නායකයා සතු වන්නේය. එවැනි අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි යහපැවැත්ම සඳහා අවශ්‍යයැයි නායකයාට හැඟීයන ඕනෑම අවස්ථාවකදී කරුණු විමසීමකින් හෝ හේතු දැක්වීමකින් තොරව වුවද ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය සහ ඔහු විසින් දරන පක්ෂයේ තනතුර හෝ තනතුරු අත්හිටුවීමට පක්ෂ නායකයාට බලය ඇත්තේය.

xiv. අවස්ථාවෝචිතව පක්ෂ මහ සම්මේලනය සඳහා සහභාගීවීම පිණිස දෙස් විදෙස් අමුත්තන්ට ආරාධනා කිරීමට පක්ෂ නායකයාට බලය ඇත්තේය.

xv. පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ ඕනෑම නිලධාරියෙකුගේ නිලය අත්හිටුවීම පක්ෂයේ යහපැවැත්ම සඳහා අවශ්‍ය බවට පක්ෂ නායකයාගේ මතය වන විට එම නිලධාරියාගේ නිලය වහාම අත්හිටුවීමට පක්ෂ නායකයා හට බලය ඇති අතර එසේ අත්හිටුවීමෙන් දින 30 ක් ඇතුලත ඒ සම්බන්ධයෙන් සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට දේශපාලන මණ්ඩලයට යොමුකළ යුතුය.

xvi. පක්ෂ නායකයාගේ බලය කිසිවෙකු විසින් අභියෝගයට ලක්කළ නොහැක්කේය.

## 12 වන වගන්තිය

### පක්ෂ සභාපතිවරයා සහ මහ ලේකම්වරයා

(අ) පක්ෂ සභාපතිවරයා

i. පක්ෂ සභාපතිවරයා පත්කළ යුත්තේ විධායක සභාව විසිනි.

ii. පක්ෂයේ ප්‍රකාශ සහ ප්‍රතිපත්ති සැලසුම් ආදිය සකස් කිරීම පක්ෂ සභාපතිවරයාගේ අධීක්ෂණයට ලක්විය යුතුය.

iii. පක්ෂ නායකයා නොමැති අවස්ථාවකදී පක්ෂ නායකයා විසින් මුලසුන දැරිය යුතු පක්ෂ සංවිධානයක හෝ මණ්ඩලයක මුලසුන දැරිය යුත්තේ සභාපතිවරයා විසිනි.

iv. පක්ෂ නායකයා විසින් පවරනු ලබන කවර හෝ කාර්යයක් මනා වගකීමෙන් යුතුව ඉටුකිරීම සභාපතිවරයාගේ වගකීම වන්නේය.

(ආ) පක්ෂ මහ ලේකම්වරයා

i. පක්ෂ මහ ලේකම්වරයා පත්කළ යුත්තේ පක්ෂ නායකයාගේ යෝජනාවෙන් විධායක සභාව විසිනි.

ii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි නිල මුද්‍රාව තිබිය යුත්තේ මහ ලේකම්වරයා භාරයේය.

iii. පක්ෂය විසින් නිකුත් කරනු ලබන නියෝග, චක්‍රලේඛ ආදිය බලාත්මක වීම සඳහා මහ ලේකම්වරයා විසින් අත්සන් තැබිය යුත්තේය.

iv. මැතිවරණ නීති රීති මඟින් පක්ෂ ලේකම්වරයෙකුට පැවරෙන සියලු කටයුතු සම්බන්ධ වගකීම් මහ ලේකම්වරයාට පැවරෙන අතර ඔහු පක්ෂ නායකයාගේ සහ දේශපාලන මණ්ඩලයේ උපදෙස් පරිදි එම කාර්ය භාරය මනාව ඉටුකිරීමට බැඳී සිටින්නේය.

v. පළාත් පාලන, පළාත් සභා සහ පාර්ලිමේන්තු මැතිවරණ ඇතුළු ඕනෑම මැතිවරණයක් සඳහා පක්ෂය විසින් ඉදිරිපත් කරන නාම යෝජනා පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර දේශපාලන මණ්ඩලයේ නිර්දේශය සහ පක්ෂ නායකයාගේ පූර්ණ අනුමැතිය මත අත්සන් තබා අදාල බලධාරීන් වෙත නිසි කලට භාරදීම ලේකම්වරයාගේ ප්‍රධාන වගකීමක් වන්නේය.

(ඇ) වැඩ බලන මහ ලේකම්වරයා

i. **පක්ෂ මහ ලේකම්වරයා සිය ධූරයේ කටයුතු කිරීමට නොහැකි ලෙස කායිකව හෝ මානසිකව රෝගී තත්වයේ පසුවන්නේයැයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලය විසින් සනාථ කරගත් විටකදී හෝ විදේශ ගතවීම, ඉල්ලා අස්වීම, සාමාජිකත්වයෙන් නෙරපීම, අත්හිටුවීම හෝ පක්ෂය හැරයාම වැනි පක්ෂ මහ ලේකම් ධූරය හිස්වන ඕනෑම අවස්ථාවක වහාම පක්ෂ නායකයා විසින් සුදුසුයැයි තීරණය කරන වෙනත් අයෙකු පක්ෂයේ වැඩ බලන මහ ලේකම්වරයා ලෙස පත්කිරීමට පක්ෂ නායකයාට බලය ඇත්තේය.**

ii. මෙම ව්‍යවස්ථාවෙන් මහ ලේකම්වරයාට පැවරෙන සියලු වගකීම් හා කාර්ය භාරය වැඩ බලන කාලය තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට වැඩ බලන මහ ලේකම්වරයාට බලය පැවරෙන්නේය.

iii. නාම යෝජනා පත්‍ර අත්සන් තැබීම ඇතුලු මැතිවරණ නීති රීති යටතේ පක්ෂ මහ ලේකම්වරයෙකුට පැවරෙන සෑම වගකීමක්ම ඉටු කිරීමට ද වැඩ බලන මහ ලේකම්වරයා බැඳී සිටින්නේය.

## 13 වන වගන්තිය

(අ) **ජාතික සංවිධායක**

i. පක්ෂයේ ජාතික සංවිධායකවරයා පත්කළ යුත්තේ පක්ෂ නායකයාගේ යෝජනාවෙන් විධායක සභාව විසිනි.

ii. පක්ෂයේ අනුබද්ධ සංවිධාන සහ විවිධ සංවිධානවල කාර්ය භාරයන්, ශාඛා සමිති, ආසන බලමණ්ඩල ඇතුලු සියලු සංවිධාන කටයුතු සොයාබලා එම අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ වගකීම ජාතික සංවිධායකවරයා සතු වන්නේය.

iii. සියලු මැතිවරණවල දී පක්ෂ නායකයාගේ අනුමැතිය මත අවශ්‍ය මෙහෙයවීම් කිරීමට ජාතික සංවිධායකවරයාට බලය හිමි වන්නේය.

iv. පක්ෂ නායකයාගේ උපදෙස් පරිදි සහෝදර දේශපාලන පක්ෂ, ජාතික සංවිධාන, සිවිල් සංවිධාන ආදී පක්ෂයේ පරිභාහිර සම්බන්ධතා ආරම්භ කිරීම, පවත්වාගෙනයාම ආදිය පිළිබඳ වගකීම ජාතික සංවිධායකවරයා සතු වන්නේය.

(ආ) ජාතික කැඳවුම්කරු

i. පක්ෂයේ ජාතික කැඳවුම්කරු පත්කළ යුත්තේ විධායක සභාව වන අතර ඒ සඳහා සුදුසු නමක් නිර්දේශ කිරීමට පක්ෂ නායකයාට බලය තිබේ.

ii. පක්ෂ නායකයාගේ උපදෙස් පරිදි පක්ෂයේ ආසන සංවිධාන, දිස්ත්‍රික් සංවිධාන හෝ අනුබද්ධ සංවිධාන බලගැන්වීමේ වගකීම ජාතික කැඳවුම්කරු සතුවන්නේය.

iii. ජාතික කැඳවුම්කරු විසින් කවර හෝ මැතිවරණයක දී පක්ෂ නායකයා, දේශපාලන මණ්ඩලය හෝ විධායක සභාව විසින් පවරනු ලබන කාර්යයන් සාර්ථක ලෙස ඉටු කළ යුතුය.

iv. විටින් විට පක්ෂ නායකයා, දේශපාලන මණ්ඩලය හෝ විධායක සභාව විසින් පවරනු ලබන කවර කාර්යයක් හෝ නිසි පරිදි ඉටු කිරීමට ජාතික කැඳවුම්කරු බැඳී සිටී.

## 14 වන වගන්තිය

### දේශපාලන මණ්ඩලය

(අ)

i. පක්ෂ නායක, පක්ෂ සභාපති, මහ ලේකම්, භාණ්ඩාගාරික, ජාතික සංවිධායක, ජාතික කැඳවුම්කරු සහ නියෝජ්‍ය ජාතික සංවිධායකවරුන් දෙදෙනා යන නිලධාරීන් අටදෙනා (08) දේශපාලන මණ්ඩලයේ සාමාජිකත්වය දරනු ලබන්නේය.

ii. පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් අතරින් එක් එක් දිස්ත්‍රික්කයේ අවශ්‍ය නියෝජනයක් ඇතිවන ආකාරයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිස්හයකට (36) නොවැඩි සංඛ්‍යාවක් දේශපාලන මණ්ඩලයට පත්කර ගතයුතු වන්නේය.

iii. පළාත් සභා මන්ත්‍රී සංසද සහ පළාත් පාලන මන්ත්‍රී සංසදය නියෝජනය කරමින් දෙදෙනෙකු (02) බැගින් දේශපාලන මණ්ඩලය නියෝජනය කළ යුතුය.

iv. සියලුම වෘත්තීය සමිති සම්මේලන නියෝජනය කරමින් සාමාජිකයින් දෙදෙනෙක් (02) ද, ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණ නියෝජනය කරමින් සහ ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණ නියෝජනය කරමින් එක් (01) නියෝජිතයෙකු බැගින් ද, සියලු අනුබද්ධ සංවිධාන නියෝජනය කරමින් නියෝජිතයින් දෙදෙනෙකු (02) ද වශයෙන් දේශපාලන මණ්ඩලය නියෝජනය කළ යුතුය.

v. පක්ෂ නායකයා විසින් දේශපාලන මණ්ඩලය සඳහා විස්සකට (20) නොඅඩු ප්‍රමාණයක් නම්කළ හැකි වන්නේය.

(ආ) දේශපාලන මණ්ඩලයේ බලතල හා වගකීම.

i. පක්ෂයේ ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනය කිරීමේ වගකීම සහ පක්ෂයේ දේශපාලන කටයුතු පිළිබඳ අවසන් තීන්දු තීරණ ගැනීමේ බලය ඇත්තේ දේශපාලන මණ්ඩලයටය.

ii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ප්‍රධාන මෙහෙයුම් මණ්ඩලය දේශපාලන මණ්ඩලය වන්නේය.

iii. පක්ෂයේ සමස්ත ලංකා කාරක සභාව, විධායක සභාව සහ මහ සම්මේලනය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරවීම පිළිබඳ වගකීම පැවරෙන්නේ දේශපාලන මණ්ඩලයටය.

iv. ජනාධිපතිවරණය සඳහා සුදුසු අපේක්ෂකයකු තෝරා ගැනීම පත්කර ගැනීම සහ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආදී මැතිවරණ සඳහා ඉදිරිපත් කිරීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂක නාම යෝජනා ලැයිස්තු සම්බන්ධයෙන් පක්ෂ නායකත්වයේ අනුමැතිය සහිතව අවසන් තීරණ ගැනීමේ බලය ඇත්තේ දේශපාලන මණ්ඩලයටය.

v. කිසියම් ආසන බල ප්‍රදේශයක් සම්බන්ධයෙන් සුවිශේෂි හේතු මත අතිරේක ආසන බලමණ්ඩලයක් පිහිටවිය යුතුයැයි දේශපාලන මණ්ඩලය තීරණය කරනු ලබන්නේ නම් ඒ සඳහා වන බලය දේශපාලන මණ්ඩලයට ඇත්තේය.

vi. සියලු මැතිවරණ කටයුතු මෙහෙයවීමේ අවසන් බලය සහ වගකීම පැවරෙන්නේ දේශපාලන මණ්ඩලයටය.

vii. බුද්ධි මණ්ඩලය, නාම යෝජනා මණ්ඩලය, දේපොළ හා මුදල් භාරකාර මණ්ඩලයට සාමාජිකයන් සහ ඒවායේ ප්‍රධානීන් පත්කිරීමේ බලය ඇත්තේ දේශපාලන මණ්ඩලයටය.

viii. පක්ෂ සාමාජිකයන්ගේ විනය පිළිබඳ වගකීම ඇත්තේ දේශපාලන මණ්ඩලයටය. අවශ්‍ය අවස්ථාවලදී විනය කමිටු හෝ විනය පරීක්ෂණ කමිටු පත්කිරීම, එකී විනය කමිටු හෝ පරීක්ෂණ මණ්ඩල ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශ හෝ රීති සැකසීමේ බලය දේශපාලන මණ්ඩලය සතුය.

ix. දේශපාලන මණ්ඩලයේ තීන්දුතීරණ අභියෝගයට ලක්කිරීමට කිසිම සාමාජිකයෙකුට බලය නැත්තේය.

x. පක්ෂ නායකයාට ඕනෑම අවස්ථාවකදී දේශපාලන මණ්ඩලයේ රැස්වීම් කැඳවීමට බලය ඇත්තේය.

## 15 වන වගන්තිය
### පක්ෂ මහ සම්මේලනය

(අ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි පුළුල්ම සංවිධානය පක්ෂ මහ සම්මේලනය වන්නේය.

(ආ) පක්ෂ මහ සම්මේලනය සංයුතිය පහත දැක්වෙන පරිදි වේ.

i. පක්ෂ නායකයා
ii. පක්ෂ සභාපති
iii. දේශපාලන මණ්ඩලයේ සියලු සාමාජිකයින්
iv. විධායක සභාවේ සියලු සාමාජිකයින්
v. සමස්ත ලංකා කාරක සභාවේ සියලු සාමාජිකයින්
vi. පක්ෂය නියෝජනය කරන සියලුම පාර්ලිමේන්තුවරු සහ මන්ත්‍රීවරියන්
vii. සියලුම පළාත් සභා මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන්
viii. සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්, මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන්
ix. ආසන බල මණ්ඩලවල සියලුම නිලධාරීන් සහ සාමාජිකයන්

x. ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණ සහ ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණ යන සංවිධාන දෙකේ නිලධාරී මණ්ඩල විසින් නම් කරන සාමාජිකයින් පන්සිය දෙනෙකු (500) බැගින්

xi. මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් වෘත්තීය සංවිධානවලින් නම් කරනු ලබන සාමාජිකයින් තුන්සිය පනස් දෙනා (350) බැගින්

xii. මෙම ව්‍යවස්ථාවේ 16 (ඊ) i ,ii , iii, වගන්තිවලට අනුව සුදුසුකම් ලබන්නා වූ සෑම අනුබද්ධ සංවිධානයකින්ම සාමාජිකයින් දෙසිය (200) දෙනෙකු බැගින්

xiii. පක්ෂයේ ලියාපදිංචි අනෙකුත් අනුබද්ධ සංවිධානවලින් සාමාජිකයන් දහය (10) කට නොවැඩි සංඛ්‍යාවක්,

xiv. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විශේෂ ශාඛාවලින් නම් කරනු ලබන සාමාජිකයින් දහය (10) කට නොවැඩි සංඛ්‍යාවක්,

xv. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විදේශ ශාඛා විසින් ඔවුන්ගේ සහභාගිත්වය අවශ්‍යයැයි තීරණය කරනු ලබන අවස්ථාවලදී එක් ශාඛාවකින් පස් (05) දෙනෙකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවක්; මහ සම්මේලනයේ සාමාජිකයෝ වෙති.

(ඇ) පක්ෂ මහ සම්මේලනය කැඳවීම.

i. යටත් පිරිසෙන් වර්ෂ තුනකට (03) වරක්වත් මහ සම්මේලනය කැඳවීම යෝග්‍ය වන්නේය.

ii. පක්ෂ මහ සම්මේලනය කැඳවිය යුතු දින වකවානු තීරණය කල යුත්තේ දේශපාලන මණ්ඩලය විසිනි.

(ඈ) පක්ෂ මහ සම්මේලනයේ බලතල හා කාර්ය භාරය.

i. පක්ෂ නායකයා පත්කිරීම සඳහා මහ සම්මේලනයේ අනුමැතිය හිමි විය යුතුය.

ii. පසුගිය මහ සම්මේලනයේ සිට මේ දක්වා වාර්ෂිකව සම්මත කර ඇති පක්ෂයේ අයවැය වාර්තා මහ සම්මේලනයට ඉදිරිපත් කිරීම කළ යුතුය.

iii. පක්ෂ සාමාජිකයන් විසින් පක්ෂයේ යහපත පිණිස ඉදිරිපත් කරනු ලබන යෝජනා විධායක සභාවේ නිර්දේශයෙන් සහ දේශපාලන මණ්ඩලයේ

අනුමැතියෙන් යුතුව මහ සම්මේලනයට ඉදිරිපත් කර එහි අනුමැතිය ලබාගත යුතුය.

iv. මහ සම්මේලනයට ඉදිරිපත් කරන එවැනි යෝජනා අවම වශයෙන් මාස තුන (03) කට වත් පෙර අදාළ ශාඛා සමිති වෙත පක්ෂ සාමාජිකයන් විසින් භාරදිය යුතුය. ශාඛා සමිති විසින් මහ සම්මේලනයට මාස දෙක (02) කට පෙර එම යෝජනා විධායක සභාවට භාරදිය යුත්තේය. විධායක සභාව එම යෝජනා සළකා බලා තම නිර්දේශ සමඟ සති දෙකක් (02) තුළ දේශපාලන මණ්ඩලය වෙත එම යෝජනා ඉදිරිපත් කළ යුතුය. දේශපාලන මණ්ඩලය විසින් අනුමත කරන යෝජනා මහ සම්මේලනයට මාසයකට පෙර එම යෝජනා මහ සම්මේලනයේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සඳහා එහි සංවිධායක කමිටුව වෙත භාර දිය යුතුය.

## 16 වන වගන්තිය

### අනුබද්ධ සංවිධාන

(අ) **විශේෂිත සමූහයන්ට හෝ වෘත්තීය කණ්ඩායම්වලට දේශපාලන මණ්ඩලයේ අනුමැතිය මත පක්ෂයේ අනුබද්ධ සංවිධානයක් ලෙස ලියාපදිංචි වීමට අවස්ථාව ලබාදෙන අතර එම සංවිධාන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි අනුබද්ධ සංවිධාන ලෙස පිළිගනු ලැබේ.**

(ආ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට අයත් අනුබද්ධ සංවිධාන තම සමූහය හෝ වෘත්තිකයින් අතර පක්ෂ සාමාජිකත්වය ප්‍රවර්ධනය කළ යුතු අතර ඒ ඒ සමූහයන්ගේ හෝ වෘත්තිකයින්ගේ යහපත සහ අභිවෘද්ධිය උදෙසා ද ක්‍රියාකළ යුතු වන්නේය.

(ඇ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මෙම ප්‍රධාන ව්‍යවස්ථාවට අනුකූල වන පරිදි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනම ව්‍යවස්ථාවක් අනුව කටයුතු කිරීමට සෑම අනුබද්ධ සංවිධානයකටම හැකියාව ඇත්තේය.

(ඈ) එකී සෑම අනුබද්ධ සංවිධානයකම සාමාජිකයන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ද සාමාජිකයන් විය යුතු අතර මෙම පක්ෂ ව්‍යවස්ථාවට සහ පවතින සහ මතුවට පනවන අතුරු ව්‍යවස්ථාවන්ට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටී.

(ඉ) අනුබද්ධ සංවිධානයක් පක්ෂයේ ලියාපදිංචි කිරීම සඳහා එකී සංවිධානයේ ලේකම්වරයා විසින් පක්ෂ මහ ලේකම්වරයාගෙන් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු අතර පක්ෂ නායකයාගේ අනුමැතිය මත එවැනි සංවිධානයක් පිළිගැනීමට පක්ෂයේ දේශපාලන මණ්ඩලයට බලය ඇත්තේය.

(ඊ) පක්ෂයේ ලියාපදිංචි අනුබද්ධ සංවිධාන අතුරින් පක්ෂයේ නිල ව්‍යුහයන් නියෝජනය කිරීම සඳහා පහත සඳහන් කොන්දේසි එම සංවිධාන විසින් සම්පූර්ණ කර තිබිය යුතුය.

i. පක්ෂයේ ලියාපදිංචි කවර හෝ අනුබද්ධ සංවිධානයක් ලියාපදිංචි දින සිට අදාළ නියෝජනය ලබාදෙන අවස්ථාව වන විට වර්ෂ දෙකක් (02) ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන ගොස් තිබිය යුතු අතර ඒ සඳහා වන සාක්ෂි මහ ලේකම්වරයා වෙත ඉදිරිපත්කර තිබිය යුතුය.

ii. අදාළ අනුබද්ධ සංවිධානයේ මව් සංවිධානයේ සාමාජික සංඛ්‍යාව දිස්ත්‍රික් සහ වෙනත් ශාඛා සංවිධාන ද ඇතුළුව පන් සියය (500) කට වඩා වැඩිවිය යුතුය.

iii. එවැනි අනුබද්ධ සංවිධානයක් ආසන බල මණ්ඩලය නියෝජනය කිරීමට නම් එකී බල ප්‍රදේශය තුළ එම සංවිධානයේ සාමාජික සංඛ්‍යාව අවම වශයෙන් විස්සක් (20) වත් විය යුතුය.

## 17 වන වගන්තිය

### බුද්ධි මණ්ඩලය

(අ) විවිධ ක්ෂේත්‍රයන්ට අයත් උගතුන්, බුද්ධිමතුන් සහ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත තිහ (30) කට නොවැඩි සාමාජික සංඛ්‍යාවකින් යුත් බුද්ධි මණ්ඩලයක් තෝරා පත්කිරීම සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විධායක සභාවට බලය ඇත්තේය.

(ආ) ආර්ථික සහ දේශපාලන ප්‍රතිපත්ති යෝජනා කෙටුම්පත් කිරීම, පක්ෂය මෙහෙයවීමට අවශ්‍ය උපදේශකත්වය සහ මාර්ගෝපදේශනය සැපයීම බුද්ධි මණ්ඩලයේ වගකීම වන්නේය.

(ඈ) ජාතික සහ ජාත්‍යන්තර දේශපාලන උපනතීන් හඳුනාගැනීම සහ ඒ පිළිබඳ මතය පක්ෂයේ දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කිරීම මෙම මණ්ඩලයේ වගකීමකි.

(ඇ) ජනමත විමසුම්, පර්යේෂණ සහ දැනුවත් කිරීම් පැවැත්වීම ආදිය සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලය විසින් පවත්වනු ලබන වෙනත් බුද්ධිමය සහ වෘත්තීමය කටයුතුවල වගකීමද බුද්ධි මණ්ඩලයට පැවරෙන්නේය.

(ඉ) පක්ෂයේ දේශපාලන ක්‍රියාකාරීයන් සඳහා නායකත්ව සහ පුහුණු කටයුතු සඳහා සුදුසු ආයතනික ව්‍යුහයන් ඇති කිරීම සහ එම කටයුතු පවත්වාගෙනයාමේ වගකීම ද බුද්ධි මණ්ඩලය සතුය.

(ඊ) දේශපාලනික උපාය මාර්ග නිර්නායකයන් සකස් කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒවා දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කිරීම ද බුද්ධි මණ්ඩලයේ වගකීමකි.

## 18 වන වගන්තිය

### බේරුම්කාර මණ්ඩලය

(අ) සාමාජිකයින් පස් (05) දෙනෙකුට නොඅඩු සහ දස (10) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකගෙන් සමන්විත බේරුම්කාර මණ්ඩලයක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විධායක සභාව විසින් පත්කළ යුත්තේය.

(ආ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සාමාජිකයින් අතර හෝ සංවිධාන අතර ඇතිවන ගැටලු සහ ආරවුල් නිරාකරණය කිරීම මෙම මණ්ඩලයේ ප්‍රධාන වගකීම වන්නේය.

(ඇ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙනත් දේශපාලන පක්ෂ සමඟ සන්ධානගතව ක්‍රියාකරන අවස්ථාවලදී හෝ සමගාමී අනු සංවිධාන සමඟ කටයුතු කිරීමේදී ඇතිවන ප්‍රතිවිරෝධතා සහ නොගැලපීම් විසඳීම සඳහා ද පක්ෂ නායකයා හෝ දේශපාලන මණ්ඩලය විසින් දන්වා සිටින අවස්ථාවලදී ඒවාට මැදිහත්වීමද, විසඳුම් යෝජනා කිරීමද බේරුම්කාර මණ්ඩලය විසින් කළ යුතුය.

## 19 වන වගන්තිය

### විනය මණ්ඩලය සහ විනය ක්‍රියාමාර්ග

(අ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සාමාජිකයින්ගේ සහ පක්ෂයේ සියලු සංවිධානවල විනය පවත්වාගෙනයාම සඳහා සාමාජිකයින් සත් (07) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකගෙන් යුත් විනය මණ්ඩලයක් විධායක සභාව විසින් පත්කළ යුත්තේය.

(ආ) විනය මණ්ඩලය විසින් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා විනය පරීක්ෂණ නිලධාරීන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යා යුත්තේය. ඒ ඒ අවස්ථාවන්හිදී එම ලේඛනය ඇසුරින් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා විනය නිලධාරියෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පත්කිරීමට විනය මණ්ඩලයට බලය ඇත්තේය. අදාළ විනය කඩකිරීම පිළිබඳව විමර්ශනය කිරීමට අමතරව එම විනය මණ්ඩලය මඟින් ලබා දෙන නිර්දේශයන් මත විනය කමිටුව විසින් දේශපාලන මණ්ඩලයට එම නිර්දේශයන් ඉදිරිපත් කළ යුත්තේය. එවැනි ඕනෑම විමර්ශනයක් අවම කාලසීමාවක් තුළ අවසන් කළ යුත්තේය.

(ඇ) විනය මණ්ඩලයට පක්ෂයේ විනය ක්‍රියාමාර්ග ගැනීමේදී ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් විනය රීති මාලාවක් සකස් කිරීමට හැකි අතර එකී විනය රීති මාලාව පක්ෂයේ දේශපාලන මණ්ඩලය අනුමත කිරීමෙන් පසු පක්ෂයේ විනය රීති මාලාව බවට පත්වන්නේය. පක්ෂයේ විනය රීති මාලාවේ අවශ්‍ය සංශෝධනද ඒ ආකාරයෙන්ම සිදුකළ හැකිය.

(ඈ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු යම් වරදක් සිදුකර ඇති බවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මහ ලේකම්වරයාට පැමිණිල්ලක් ලැබුණහොත් හෝ එසේ කර ඇති බවට පක්ෂයේ මහ ලේකම්වරයාට පෙනී ගිය විට පක්ෂයේ උපරිම යහපත සහ ආරක්ෂාව සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා පක්ෂ නායකයාගේ අනුමැතිය සහිතව එම පැමිණිල්ල විනය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුත්තේය.

(ඉ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි යම් සාමාජිකයෙකුට හෝ නිලධාරියෙකුට එරෙහිව තීරණයක් ගතයුතු යැයි මහ ලේකම්වරයාට හැඟීයන අවස්ථාවක පක්ෂයේ මහ ලේකම්වරයා විසින් එම සාමාජිකයාගේ හෝ නිලධාරියාගේ සාමාජිකත්වය සහ/ හෝ නිලය අත්හිටුවන ලෙසට නිර්දේශ කරමින්

වාර්තාවක් පක්ෂයේ නායකයා වෙත ඉදිරිපත් කළ හැකි අතර එවැනි වාර්තාවක් මත එම සාමාජිකයාගේ සහ/ හෝ නිලධාරියාගේ සාමාජිකත්වය සහ/ හෝ නිලය අත්හිටුවීමට පක්ෂ නායකයාගේ අනුමැතිය සහිතව පක්ෂ මහ ලේකම්වරයාට බලය ඇත්තේය. එවැනි තීරණයක් ගනු ලැබූ අවස්ථාවකදී ඊළඟ පවත්වනු ලබන දේශපාලන මණ්ඩලයට එකී තීරණය දැනුම් දිය යුතු අතර එවැනි සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු විසින් නිදහස සඳහා කරුණු ඉදිරිපත් කිරීමක් ඇත්තේ නම් එය ද දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කළ යුත්තේය.

(ඊ) පක්ෂ නායකයා විසින් යම් පක්ෂ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අත්හිටුවීමක් සිදුකර ඇති අවස්ථාවකදී ඒ පිළිබඳ විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විනය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පක්ෂ ලේකම්වරයාට බලය ඇත්තේය.

(උ) මෙම ව්‍යවස්ථාව, පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් පනවනු ලබන රීති, ස්ථාවර නියෝග, තීරණ, නියමයන් හෝ ආචාරධර්ම පද්ධතිය උල්ලංඝනය කරමින් හෝ අනුගමනය කිරීම පැහැර හරිමින් හෝ පක්ෂයේ උන්නතියට හානිවන ආකාරයට කටයුතු කරන හෝ පක්ෂය අපකීර්තියට පත් කරවමින් කටයුතු කරන කවර සාමාජිකයෙකු වුවද විනය ක්‍රියාමාර්ගවලට යටත් විය යුතු අතර එවන් සාමාජිකයෙකුගේ හෝ නිලධාරියෙකුගේ සාමාජිකත්වය හෝ ධූරය අත්හිටුවීමට හෝ සාමාජිකත්වයෙන් නෙරපීමට හෝ වෙනත් සුදුසු විනය නියෝගයක් ලබාදීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත්තේය.

(ඌ) ඉහත සඳහන් පරිදි දේශපාලන මණ්ඩලය මඟින් සහ/ හෝ පක්ෂයේ නායකයා විසින් විනය සම්බන්ධ කටයුතු පිළිබඳව ගනු ලබන තීරණයක් පිළිපැදීමට සියලුම සාමාජිකයන් බැඳී සිටින අතර එබඳු තීරණයක් අභියෝගයට ලක්කළ නොහැක්කේය.

## 20 වන වගන්තිය

### දේපොළ හා මුදල් භාරකාර මණ්ඩලය

(අ) පක්ෂයේ විධායක සභාව විසින් පක්ෂයට අයත් දේපොළ හා මුදල් සම්බන්ධ භාරකාරත්වය දැරීම පිණිස මණ්ඩලයක් පත්කළ යුත්තේය. එම මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි විය යුතුය.

i. සභාපති (පක්ෂ නායක)
ii. පක්ෂ සභාපති
iii. පක්ෂ මහ ලේකම්
iv. භාණ්ඩාගාරික
v. විධායක සභාව විසින් තම සාමාජිකයින් අතරින් තෝරාගත් පස් (05) දෙනෙකුට වැඩි නොවන සාමාජික සංඛ්‍යාවක්

(ආ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට අයත් මුදල් සහ නිශ්චල, චංචල දේපොළ පාලන කිරීමට සහ නඩත්තු කිරීම මෙම මණ්ඩලයේ වගකීම වේ.

(ඇ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි නිලධාරී මණ්ඩලයේ අනුමැතියට යටත්ව පක්ෂයට අරමුදල් රැස්කිරීම, චංචල හා නිශ්චල දේපොළ මිළට ගැනීමේ වගකීම මෙම මණ්ඩලය සතු වන්නේය.

(ඈ) පක්ෂ අරමුදල් තැන්පත් කිරීම සහ ගනුදෙනු කිරීම සඳහා අවශ්‍ය ජංගම හා ස්ථිර තැන්පත් ගිණුම් බැංකුවල විවෘත කිරීමේ බලය සහ අත්සන් තැබීමේ බලයලත් නිලධාරීන් පත්කළ යුත්තේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලය විසින් වන අතර එම ගිණුම් පවත්වාගෙන යාම මෙම මණ්ඩලයේ වගකීම වන්නේය.

## 21 වන වගන්තිය

### නාම යෝජනා මණ්ඩලය

(අ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දේශපාලන මණ්ඩලයට එක් එක් මැතිවරණ සහ ඡන්ද විමසීම් ආශ්‍රිතව විටින් විට සාමාජිකයින් දස (10) දෙනෙකුට නොවැඩි නාම යෝජනා මණ්ඩලයක් පත්කිරීමට බලය ඇත්තේය.

(ආ) මෙම නාම යෝජනා මණ්ඩලයට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම, පළාත් සභා සහ පාර්ලිමේන්තු මැතිවරණ සඳහා සුදුසු අපේක්ෂකයින් තෝරාගැනීම පිණිස ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලයේ අනුමැතිය සහිතව අනු නාම යෝජනා මණ්ඩල එකක් හෝ කීපයක් පත් කිරීමට හැකියාව ඇත්තේය.

(ඇ) නාම යෝජනා මණ්ඩලවල ප්‍රමාණය, පත් කළ යුතු සාමාජික සංඛ්‍යාව සහ නාම යෝජනා ලබාදීමේදී යොදාගත යුතු නිර්ණායක කවරේද

යන්න තීරණය කරනු ලබන්නේ පක්ෂ නායකයාගේ පූර්ණ අනුමැතිය සහිතව පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසිනි.

## 22 වන වගන්තිය
### ප්‍රවර්ධන සහ ප්‍රචාරණ මණ්ඩලය

(අ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි විධායක සභාව විසින් සමාජිකයින් දස (10) දෙනෙකුට නොවැඩි ප්‍රවර්ධන සහ ප්‍රචාරණ මණ්ඩලයක් පත්කර ගත යුතුය.

(ආ) මෙම මණ්ඩලයේ වගකීම සහ කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ප්‍රවර්ධනය, පක්ෂයේ කීර්තිනාමය දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ඉහළට එසවීමයි.

(ඇ) ඕනෑම මැතිවරණයකදී, ඡන්ද විමසීමකදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මතය සහ ප්‍රතිපත්තිය සාර්ථකව ජනගත කිරීමත් එකී මැතිවරණවලදී, ඡන්ද විමසීම්වලදී පක්ෂය ජයග්‍රහණය කරවීම සඳහා අවශ්‍ය ප්‍රචාරක කටයුතු සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීමද කමිටුවෙහි වගකීමකි.

## දෙවන කොටස

ව්‍යවස්ථාවෙහි මෙම කොටසෙහි අන්තර්ගත වන්නේ ජාතික අභිලාෂයන් ජයගැනීම සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමඟ ඒකාබද්ධව ක්‍රියාකිරීමට කැමති මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි හෝ ලියාපදිංචි නොවූ දේශපාලන පක්ෂ සහ/හෝ විවිධ සිවිල් සංවිධාන සමඟ ඇති කරගන්නා වූ සංවිධාන ව්‍යුහයන්ය.

## 23 වන වගන්තිය
### අන්තර් කමිටු

(අ) ජාතික අභිලාෂයන් ජයගැනීම සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමඟ ඒකාබද්ධව ක්‍රියාකිරීමට කැමති මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි හෝ ලියාපදිංචි නොවූ දේශපාලන පක්ෂ සහ විවිධ සිවිල් සංවිධාන සමඟ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම, පළාත් සභා මැතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ, ජනාධිපතිවරණ සහ ජනමත විචාරණ ජයග්‍රහණය කිරීම සඳහා ඇති කරගන්නා වූ තාවකාලික හෝ ස්ථිර කමිටු පිහිටවීමට මෙයින් බලය හිමිවන්නේය.

(ආ) ඉහත දක්වන ලද කමිටුවල කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හෝ ඒකාබද්ධ සන්ධානය විසින් පවරනු ලබන මැතිවරණ කාර්යයන්, සහ වෙනත් ඕනෑම දේශපාලන කාර්යයක් සාර්ථක කිරීම සඳහා අවංකව සහ උපරිම කැපවීමෙන් ඉටු කිරීමය.

## 24 වන වගන්තිය

### ඡන්දපොළ කමිටු හා/ හෝ කොට්ඨාශ කමිටු

(අ) සෑම ඡන්ද මධ්‍යස්ථානයක් සඳහාම ඡන්දපොළ/ හෝ කොට්ඨාශ කමිටුවක් පිහිටවිය හැක්කේය.

i. එකී කමිටුවල සාමාජිකයින් විය යුත්තේ එම කමිටු බලප්‍රදේශය තුළ ජීවත්වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි හෝ ඒකාබද්ධ සන්ධානයේ අනෙකුත් පක්ෂවල සාමාජිකයින් අතරින් එකී පක්ෂ විසින් නම් කරනු ලබන සාමාජිකයින්ය.

ii. ඡන්දපොළ බලප්‍රදේශය තුළ මැතිවරණ කටයුතු මෙහෙයවීම මෙම කමිටුවට පැවරෙන්නේය .

## 25 වන වගන්තිය

### කළාප කමිටු

(අ) සමෘද්ධි කලාප සීමාව වැනි පවතින පැහැදිලි සීමාවක් කලාප කමිටු බලප්‍රදේශය ලෙස තෝරා ගැනීමට පක්ෂයේ දේශපාලන මණ්ඩලයට බලය තිබේ.

(ආ) ප්‍රදේශයේ භූගෝලීය විශාලත්වය, ජන ඝනත්වය ඉහළ මට්ටමක පැවතීම හෝ පක්ෂයේ දේශපාලන මණ්ඩලය සෑහීමට පත්වන වෙනත් හේතුවක් මත බලප්‍රදේශ තුළ කලාප කමිටු දෙකක් හෝ වැඩි ගණනක් පිහිටුවීමට දේශපාලන මණ්ඩලයට හැකියාව ඇත්තේය.

(ඇ) එම කමිටු බලප්‍රදේශය තුළ ජීවත්වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි හෝ ඒකාබද්ධ සන්ධානයේ අනෙකුත් පක්ෂවල සාමාජිකයින් හෝ නම් කරන ලද සාමාජිකයින් මෙම කමිටුවල සාමාජිකයෝ වෙති.

(ඈ) කවර නම් මැතිවරණයකදී හෝ ජනමත විචාරණයකදී අදාළ බලප්‍රදේශය තුළ එකී මැතිවරණ ජයග්‍රහණය කිරීම සඳහා මෙම කමිටු ඇප කැප විය යුත්තේය. එහිදී ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානයෙන් දෙන උපදෙස් පරිදි ප්‍රාදේශීය සම්පත් මධ්‍යස්ථානය සහ කළමණාකරණ මණ්ඩලය ලෙස ක්‍රියාකිරීමට ද මෙම කමිටුවලට බලය තිබේ.

## 26 වන වගන්තිය

### දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු

(අ) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙහි සංයුතිය දිස්ත්‍රික්කය තුළ ජීවත්වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සහ/හෝ ඒකාබද්ධ සන්ධානයේ අනෙකුත් පක්ෂවල සාමාජිකයින්ගෙන් හෝ නම් කරන ලද සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය.

(ආ) මැතිවරණ කාර්ය පටිපාටිය දිස්ත්‍රික්ක මට්ටමෙන් සම්බන්ධීකරණ, ක්‍රියාවට නැංවීම සහ එකී මැතිවරණ හෝ ජනමත විචාරණ දිස්ත්‍රික්කය තුළ ජයග්‍රහණය කරවීම කමිටුවේ වගකීමක් වන්නේය.

## 27 වන වගන්තිය

### පළාත් සභා මන්ත්‍රී සංසදය

(අ) පළාත් සභා මන්ත්‍රී සංසදය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සහ ඒ හා සමඟ ඒකාබද්ධව ක්‍රියා කරන පක්ෂවල පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් සැඳුම් ලබන්නා වූ සංවිධානයකි.

(ආ) පළාත් සභා මන්ත්‍රී සංසදයේ කාර්යභාරය සහ වගකීම වන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සහ ඒ හා සමඟ ඒකාබද්ධව ක්‍රියා කරන පක්ෂවල පොදු දේශපාලන අභිලාශයන් වෙනුවෙන් සහ පළාත් සභා සහ ඒවායේ නියෝජිතයින්ට මුහුණ දීමට සිදුවන අභියෝගයන්හිදී එක්ව ක්‍රියාකිරීමයි.

## 28 වන වගන්තිය

### පළාත් පාලන මන්ත්‍රී සංසදය

(අ) පළාත් පාලන මන්ත්‍රී සංසදය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සහ ඒ හා සමඟ ඒකාබද්ධව ක්‍රියා කරන පක්ෂවල පළාත් පාලන සභිකවරුන්ගෙන් සැඳුම් ලබන්නා වූ සංවිධානයකි.

(ආ) පළාත් පාලන මන්ත්‍රී සංසදයේ කාර්යභාරය සහ වගකීම වන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සහ ඒ හා සමඟ ඒකාබද්ධව ක්‍රියා කරන පක්ෂවල පොදු දේශපාලන අභිලාශයන් වෙනුවෙන් සහ පළාත් පාලන නියෝජිතයින්ට මුහුණ දීමට සිදුවන අභියෝගයන්හිදී එක්ව ක්‍රියා කිරීමයි.

## 29 වන වගන්තිය
### අන්තර් සහයෝගීතා සංවිධාන

(අ) ප්‍රධාන දේශපාලන දහරාවන්ගෙන් බැහැරව සිටින විවිධ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මත නියෝජනය කරන ලියාපදිංචි වූ සහ නොවූ දේශපාලන පක්ෂ, ආගමික හෝ ජනවාර්ගික පක්ෂ හෝ සංවිධාන, පොදුජන සංවිධාන, වෘත්තීය සංවිධාන් සහ සිවිල් සංවිධානවලට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි අන්තර් සහයෝගීතා සංවිධාන වශයෙන් වෙන වෙනම ලියාපදිංචි වීමට අවකාශ ඇත්තේය.

(ආ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ එකී සංවිධානයන් අතර අවබෝධතාව සහ සම්බන්ධතාව පවත්වාගෙනයාම සඳහා දෙපාර්ශවයම එකඟ වන සහයෝගීතා ගිවිසුමකට එළඹීමට හැකියාව ඇත්තේය.

(ඇ) ඒ සඳහා එකී පක්ෂ හෝ සංවිධාන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලයෙන් ඉල්ලීමක් කරන ලද කල්හී ඒ පිළිබඳව සළකා බලා අවසර දීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත්තේය.

## 30 වන වගන්තිය
### උත්තර සභාව

(අ) රටේ ඒකීයභාවය, ජාතික ආරක්ෂාව, සීඝ්‍ර ආර්ථික සංවර්ධනය සහතික කරමින් එම සංවර්ධනයේ ප්‍රතිඵල ජනතාවගේ සමෘද්ධිය උදෙසා යොමුකිරීමේ අභිලාෂයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමට කැමති එහෙත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සාමාජිකත්වය නොදරන ජාතික නායකයින්, දේශපාලන පක්ෂ නායකයින්, විවිධ දේශපාලන පක්ෂවලට අයත් එහෙත් ප්‍රතිපත්තිමය කරුණු මත පාර්ලිමේන්තුවේ, පළාත් සභාවල හෝ පළාත් පාලන ආයතනවල ස්වාධීනව කටයුතු කරන සභිකවරුන් සහ සභිකවරියන් ද, ලියාපදිංචි නොවූ දේශපාලන පක්ෂ සහ සිවිල් සංවිධානවල නායකයින් ද මෙම උත්තර සභාවෙහි සාමාජිකයින් වෙති.

(ආ) උත්තර සභාවෙහි සාමාජිකයින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සාමාජිකයින් නොවන නමුත් තම අභිමතය පරිදි පක්ෂ සාමාජිකත්වය ලබාගැනීමට ඔවුනට අයිතියක් ඇත්තේය.

(ඇ) උත්තර සභාවෙහි සාමාජික සංඛ්‍යාව සියයකට (100) නොවැඩි විය යුත්තේය.

(ඈ) මෙම මණ්ඩලය සඳහා නායකයෙකු පත්කර ගැනීම එම මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් සිදු කළ යුතුය.

(ඉ) පක්ෂයේ හෝ ඒකාබද්ධ සන්ධානය මෙහෙයවන ඕනෑම දේශපාලන කටයුත්තකට සහභාගීවීමට මෙහෙයවීමට මෙම මණ්ඩලයේ සාමාජිකයින්ට අයිතිය ඇත්තේය.

(ඊ) පක්ෂයේත්, රටේත් අභිවෘද්ධිය පිණිස තම විශේෂඥතාව හෝ නායකත්වය ලබාදීම මෙම මණ්ඩලයේ සාමාජිකයින්ගේ වගකීම වන්නේය.

# තුන්වන කොටස

ව්‍යවස්ථාවේ මෙම කොටසට ඇතුළත් වන්නේ පක්ෂයේ පාලන ව්‍යුහය සහ පොදු විධිවිධාන පිළිබඳවය.

## 31 වන වගන්තිය
### පොදු විධි විධාන

(අ) මෙම ව්‍යවස්ථාව යටතෙහි ශ්‍රී ලංකා පොදුජන කාන්තා පෙරමුණ, ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණ, සමගාමී සංවිධාන, අනුබද්ධ සංවිධානවල ව්‍යවස්ථාවන් සැළකිය යුත්තේ මෙම ව්‍යවස්ථාවේ අනු ව්‍යවස්ථාවන් වශයෙනි. එබැවින් එම ව්‍යවස්ථාවන්හි කුමක් සඳහන් වුවද එම සංවිධානවල සියලු සාමාජිකයින් මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් බැඳීම් හා වගකීම්වලට යටත් වන්නේය.

(ආ) පක්ෂයේ අනුබද්ධ සංවිධාන, වෘත්තීය සමිති හෝ වෙනම ව්‍යාවස්ථාවක් සහිත පක්ෂයේ වෙනත් කවර සංවිධානයක් වුවද ගනු ලබන තීන්දු තීරණ මෙම පක්ෂ ව්‍යවස්ථාවට අනුකූල විය යුතුය.

(ඇ) විශේෂ කොට දක්වා නොමැති අවස්ථාවලදී පක්ෂයේ සෑම සංවිධානයකම නිල කාලය වසර දෙකක් (02) වන්නේ. ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණේ සභාපතිවරයෙකුට එම තනතුර දැරිය හැක්කේ එක් වරක් පමණක් වන අතර ශ්‍රී ලංකා පොදුජන උපාධිධාරී සංගමයේ සාමාජිකයෙකු රැකියාවකට ගිය පසු උපාධිධාරී සංගමයෙන් ඉවත්ව අදාළ වෘත්තීය සමිතියකට ඇතුළත් විය හැකිය.

(ඈ) මෙම ව්‍යවස්ථාවෙහි දැක්වෙන සංවිධානවලට හෝ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා එක්ව ක්‍රියා කරන අන්තර් සහයෝගීතා සංවිධානවලට එකී සංවිධාන යටතේ අවශ්‍ය අවස්ථාවලදී උප සංවිධාන/ මෙහෙයුම් සංවිධාන/ ආංශික සංවිධාන පවත්වා ගෙන යාමට බාධාවක් නැත්තේය.

(ඉ) මෙම ව්‍යවස්ථාවේ විශේෂ කොට දක්වා නොමැති අවස්ථාවලදී නිර්දිෂ්ට සංවිධානවල රැස්වීම්වල සණ පූර්ණය වන්නේ එම සංවිධානයේ සාමාජිකයින්ගෙන් පහෙන් එකක් (1/5) විය යුතුය.

(ඊ) මෙම ව්‍යවස්ථාවෙහි නිර්දිෂ්ට සංවිධානවල නව නිලධාරී මණ්ඩල පත්වන තෙක් පැරණි නිලධාරී මණ්ඩලය ක්‍රියාත්මක විය යුත්තේය.

(ඩ) යම් මණ්ඩලයක හෝ සංවිධානයක හෝ පක්ෂ සම්මේලනය සඳහා සාමාජිකයයෙකු හෝ ඊට වඩා වැඩි ගණනක් පත් නොකර තිබීම, නියමිත සංවිධානයක් හෝ කීපයක් පිහිටුවා නොතිබීම මත හෝ ක්‍රියාත්මක නොවීම මත පක්ෂයේ ක්‍රියාකාරීත්වය පවත්වා ගෙනයාමට මොනම ආකාරයේ හෝ නීතිමය බාධාවක් නොවිය යුත්තේය.

(ඪ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ශාඛා සමිති ඇතුළු සෑම සංවිධානකම නිලවරණ සඳහා දින වකවානු තීරණය කළ යුත්තේ දේශපාලන මණ්ඩල විසිනි.

(ණ) මෙම ව්‍යවස්ථාවෙහි කිසියම් තනතුරක් සම්බන්ධයෙන් පුරුෂ ලිංගාර්තයෙන් දැක්වෙන පදවල අවස්ථාවෝචිතව ස්ත්‍රී ලිංගාර්තයද වලංගු වන්නේය.

(ත) මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ට කවර හෝ සංවිධානයක සාමාජිකයකු හේතුවක් නොදන්වා අදාළ සංවිධානයේ රැස්වීම් වාර තුනකට වැඩි වාර ගණනක් අඛණ්ඩව නොපැමිණියේ නම් ඔහු සහ/හෝ ඇයගේ හෝ එම සංවිධානයේ සාමාජිකත්වය අහෝසි කළ හැකිය.

(ථ) මෙම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කර ඇති කවර හෝ සංවිධානයක නිලධාරියෙකු එම සංවිධානයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් කවර හේතුවක් නිසා හෝ පුරප්පාඩු වුවහොත්, එම සංවිධානයේ ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම සඳහා අවශ්‍යයැයි හැඟෙන අවස්ථාවක ඒ සඳහා සුදුස්සෙකු පත්කිරීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත්තේය.

(ද) මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ට කවර සංවිධානයක හෝ අනු සංවිධානයක හෝ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක (1/3) අත්සනින්, ලිඛිත ඉල්ලීමක් කරන්නේ නම් මාසයක් තුළ එම සංවිධානයේ සභාපති හෝ ලේකම් විසින් විශේෂ රැස්වීමක් කැඳවීමට වගබලා ගත යුතුය. එම ඉල්ලීමේ රැස්වීම කැඳවීමේ හේතුව නිවැරදිව හා සත්‍යව දැන්විය යුතු අතර, රැස්වීම කැඳවීමේ ලිපියේද එම හේතුව ඇතුලත් විය යුතුය.

(ධ) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කිසියම් සාමාජිකයෙකු වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය හෝ තනතුරක් ලබාගෙන්නේ නම් හෝ වෙනත් පක්ෂයකින්, සන්ධානයකින් හෝ ස්වාධීනව හෝ කවර හෝ මැතිවරණයකට තරඟ කරන්නේ නම් ඔහු හෝ ඇයගේ ශ්‍රී ලංකා පොදුජන

පෙරමුණේ පක්ෂ සාමාජිකත්වයද ඒ වන විට පක්ෂයේ කිසියම් තනතුරක් දරන ලද්දේ නම් එකී සියලුම තනතුරුද අහෝසි වී යන්නේය.

(ග) මෙම ව්‍යවස්ථාවේ කිසිදු ස්ථානයක අන්‍යාකාරයකින් සඳහන් වුවද එය නොසලකා පක්ෂ නායකයාට අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී දේශපාලන මණ්ඩලයට, විධායක සභාවට සහ සමස්ථ ලංකා කාරක සභාවට පක්ෂ නායකයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් අලුතින් පත්කිරීමට හෝ පක්ෂ නායකයා විසින් පත්කරනු ලැබූ සාමාජිකයෙකු ඉවත් කොට ඒ වෙනුවට නව සාමාජිකයෙකු පත්කිරීම සිදුකිරීමට බලය තිබිය යුත්තේය.

(ඝ) මෙම ව්‍යවස්ථාවේ ඇති සියලු විධිවිධාන සෑම සාමාජිකයෙකුටම අදාළ වන්නේය.

(ට) **අදාළ නිලධාරී මණ්ඩලවල සාමාජිකයින්ට රැස්වීම් සඳහා භෞතික වශයෙන් සහභාගීවීමට නොහැකි අවස්ථාවලදී රැස්වීම් සඳහා අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ ද සම්බන්ධවීමට හැකිවන අතර එසේ නොවන අවස්ථාවලදී සංඝ පූර්ණය ගණනය කිරීමේදී හෝ ඡන්දය ප්‍රකාශ කිරීමේ දී ඔවුන් ඇතුළත්කර නොගත යුතු ය.**

## 32 වන වගන්තිය

### මහජන නියෝජිතයින්ගේ විනය

**i.** **පක්ෂය තුලින් පත්වන සියළුම මහජන නියෝජිතයින් පක්ෂයේ කීර්ති නාමය ආරක්ෂා වන ආකාරයෙන් සිය චර්යාව පවත්වාගත යුතුය.**

**ii.** **පක්ෂය තුලින් පත්වන මහජන නියෝජිතයකු කිසියම්ම හෝ අපරාධමය වරදක් සඳහා අත්අඩංගුවට පත්වූ අවස්ථාවකදී වහාම ඔහුගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීමට පක්ෂ නායකයා හට බලය ඇත්තේය.**

**iii.** **පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් කිසියම් කාරණයක් සම්බන්ධයෙන් ගන්නා ලද තීරණයක් පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව ලිඛිත දැනුම්දීමක් මගින් දැනුවත් කොට ඇති අවස්ථාවකදී එම මන්ත්‍රීවරයා එම තීරණයට පටහැනි ආකාරයෙන් පාර්ලිමේන්තුව තුල හෝ ඉන් පිටතදී කටයුතු කරනු ලැබුව හොත්, එසේ එම දේශපාලන මණ්ඩල තීරණයට පටහැනි ආකාරයෙන් කටයුතු කිරීම යන කාරුණ මත එකී මන්ත්‍රීවරයාගේ පක්ෂ සාමාජිකත්වය නිතැතින්ම අහෝසි විය යුතුය. එවැනි අවස්ථාවකදී එම**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ක්‍රියාකලාපය දැඩි පක්ෂ විනය කඩකිරීමක් ලෙස සැලකිය යුතු අතර විනය පරීක්ෂණයකින් තොරව එම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය අහෝසි කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට පක්ෂයේ මහ ලේකම්වරයාට බලය ඇත්තේය.

iv. කිසියම් පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතන සභිකවරයෙකු පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ ලිඛිතව දැනුම් දුන් තීරණයකට අනුව කටයුතු නොකිරීම යන හේතුව මත නිතැතින්ම ඔහුගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි විය යුතු අතර අදාළ මහජන නියෝජිතත්වය අවසන් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට මහ ලේකම්වරයාට බලය ඇත්තේය.

v. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සියලු සාමාජිකයෝ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මෙම ව්‍යවස්ථාවට, අතුරු ව්‍යවස්ථාවන්ට, විනය රීති සහ අනෙකුත් රීතින්ට, ස්ථාවර නියෝගවලට, නිල නිවේදන සහ දේශපාලන මණ්ඩලයේ තීරණ සහ නියෝගවලට එකඟව ක්‍රියා කිරීමට බැඳී සිටිති.

vi. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි අනුබද්ධ සංවිධාන සහ වෘත්තීය සමිතිවල සාමාජිකයන් අනුබද්ධ සංවිධාවල සාමාජිකත්වය ලබාගන්නා තැනැත්තන්ද එම සංවිධානවල ව්‍යවස්ථා සහ අතුරු ව්‍යවස්ථාවන්ට, පක්ෂයේ විනය රීති සහ අනෙකුත් රීතින්ට, ස්ථාවර නියෝගවලට, නිල නිවේදන සහ දේශපාලන මණ්ඩලයේ තීරණ සහ නියෝගවලට එකඟව ක්‍රියා කිරීමට බැඳී සිටිති. තවද එම සාමාජිකයන් මෙම ප්‍රධාන ව්‍යවස්ථාවේ විධිවිධානවලට බැඳී සිටිති.

vii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කිසියම් සාමාජිකයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරන අවස්ථාවකදී අවස්ථාවෝචිතව අදාළ වන පරිදි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී කණ්ඩායම විසින් ගන්නා තීන්දුතීරණවලට එකඟව කටයුතු කිරීමට සාමූහික වගකීමෙන් බැඳී සිටිති. තවද ඔවුන් පක්ෂය විසින් හෝ අවස්ථාවෝචිතව පාර්ලිමේන්තු කණ්ඩායම් නායකයා විසින් දෙනු ලබන උපදෙස් අනුව ක්‍රියාකිරීමට බැඳී සිටින අතර ඊට එරෙහිව ක්‍රියාකරමින් වෙනත් ස්ථාවරයක් දැරීම, ප්‍රසිද්ධියේ විවේචනය කිරීම, ඡන්දය ප්‍රකාශ කිරීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීම ද පක්ෂයේ විනය කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

viii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කිසියම් සාමාජිකයෙකු පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු ලෙස කටයුතු කරන අවස්ථාවකදී එකී පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ යම්

කරුණකට අදාළව එකී කණ්ඩායම් ප්‍රධානීන් විසින් දෙනු ලබන උපදෙස්වලට අනුව ක්‍රියාකළ යුත්තේය. ඊට අමතරව එකී ආයතනවල වෙනත් පක්ෂ කණ්ඩායම්වලට සහය දක්වීම, තම කණ්ඩායම පරාජයට පත්කිරීම සඳහා ක්‍රියා කිරීම හෝ අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීම ආදිය මෙම ව්‍යාවස්ථාවට අනුව පක්ෂයේ විනය කඩකිරීමක් ලෙස සලකා ක්‍රියා කිරීමට පක්ෂ මහ ලේකම්වරයාට බලය ඇත්තේය.

ix. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කිසිදු සාමාජිකයෙක් විසින් එහි කවර තරාතිරමේ තවත් සාමාජිකයෙකුට ශාරීරික හිංසා කිරීම, තර්ජනය කිරීම, පරිභව කිරීම, අපහාස කිරීම, හෝ සාමාජිකයෙකු ප්‍රසිද්ධියේ විවේචනය කිරීම හෝ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රතිපත්ති හෝ දේශපාලන මණ්ඩලයේ තීරණ ප්‍රසිද්ධියේ විවේචනය කිරීම නොකළ යුත්තේය.

x. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කිසිදු සාමාජිකයෙක් වෙනත් දේශපාලන පක්ෂයකට සහයෝගය දක්වන බව ප්‍රකාශ කිරීම හෝ ඒ බවට හැඟවෙන ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයක් විසින් පාලනය කරනු ලබන ආණ්ඩුවක සහ/හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයකට සහයෝගය දක්වන ප්‍රකාශ කිරීම හෝ ඒ බවට හැඟවෙන ප්‍රකාශ කිරීම හෝ පක්ෂයට අගතිදායක ප්‍රතිඵල ගෙන දෙන සහ/හෝ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අපකීර්තියට පත්කරන වෙනත් ඕනෑම ක්‍රියාවක නිරත නොවිය යුත්තේ ය.

xi. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් කිසියම් සාමාජිකයෙකුට/ සාමාජිකයින්ට කවර හෝ මැතිවරණයකදී හෝ ඡන්ද විමසීමකදී අපේක්ෂකත්වය ලබාදීමට පක්ෂය විසින් තීරණය කිරීමෙන් පසුව එකී අපේක්ෂකයා හෝ අපේක්ෂයින්ගේ ජයග්‍රහණය සහතික කිරීම සඳහා පක්ෂයේ සියලු සාමාජිකයන් උපරිම කැපවීමෙන් සහයෝගය දිය යුතුය. ඊට අමතරව එකී නාම යෝජනා ලබාදීමට එරෙහිව කටයුතු කිරීම හෝ නාමයෝජනා ලබාදීමෙන් පසුව එය විවේචනය කිරීමට ක්‍රියාකිරීම හෝ පක්ෂයේ අපේක්ෂකයින්ට විරුද්ධව ඉදිරිපත් වන වෙනත් තැනැත්තන්ට කිසිදු සහයෝගයක් දැක්වීම නොකළ යුතුය.

xii. කිසියම් මැතිවරණයක් සඳහා පක්ෂයෙන් අපේක්ෂකයෙකු නාම යෝජනාකර නොමැති අවස්ථාවක දී සාමාජිකයින් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් මහ ලේකම්වරයා හරහා විධාන නිකුත් කිරීමේ බලය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලය සතු වන අතර එකී විධාන සියලුම සාමාජිකයන් විසින් පිළිපැදිය යුතුය.

xiii. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කිසිදු සාමාජිකයෙකු දේශපාලන මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව වෙනත් දේශපාලන පක්ෂයක හෝ සන්ධානයක සාමාජිකත්වය ලබාගැනීම, තනතුරක් හෝ තනතුරු භාරගැනීම නොකළ යුත්තේය. එවැනි අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි පක්ෂ සාමාජිකත්වය අහෝසි වන්නේය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කවර හෝ සාමාජිකයෙකු වෙනත් දේශපාලන පක්ෂයක් /සන්ධානයක් යටතේ ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධූරය සඳහා නාමයෝජනා ලබාගැනීම, පාර්ලිමේන්තු මැතිවරණයක්, පළාත් සභා මැතිවරණයක් හෝ පළාත් පාලන ඡන්ද විමසීමක් සඳහා නාම යෝජනා ලබාගැනීම, නාම යෝජනා ලැයිස්තුවක අපේක්ෂකයෙකු ලෙස නම ඇතුලත් කිරීම හෝ ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා ලැයිස්තුවක නම ඇතුළත් කිරීම ද නොකළ යුත්තේය. තවද කවර මැතිවරණයකින් හෝ ඡන්ද විමසීමෙන් පසුව පක්ෂය මාරු කිරීම/ වෙනත් දේශපාලන පක්ෂයක් හෝ සන්ධානයක් යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කිරීම, ඇමතිධූරයක් හෝ වෙනත් තනතුරක් ලබාගැනීම හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සභික ධූරයක් හෝ වෙනත් තනතුරක් ලබාගැනීම නොකළ යුත්තේය.

xiv. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි කවර හෝ සාමාජිකයෙකු පක්ෂයේ හෝ පක්ෂය ඇතුළත් සන්ධානයක් යටතේ පාර්ලිමේන්තුවට පළාත් සභාවකට හෝ පළාත් පාලන ආයතනයකට තරඟ කොට ජයලැබීමෙන් පසුව ස්වාධීනව කටයුතු කරන්නේ නම් ඔහු හෝ ඇය පක්ෂ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය යුතුය. දින තිහක කාලයක් ඇතුළත ඔහු/ ඇය එසේ නොකරන්නේ නම් පක්ෂ විනය කඩකිරීම යටතේ ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ක්‍රියාකොට ඔහුගේ හෝ ඇයගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීමට කටයුතු කිරීමට පක්ෂ මහ ලේකම්වරයාට බලය හිමිවේ.

## 33 වන වගන්තිය
### අන්තර් විධිවිධාන

(අ) මෙම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි නව නිලධාරීන් සහ දේශපාලන මණ්ඩලය පත්කර ගන්නා තෙක් දැනට ඇති ව්‍යවස්ථාව අනුව ක්‍රියාත්මක වන නිලධාරීන්ට පක්ෂය පවත්වාගෙන යාම සඳහා මෙයින් බලය පැවරෙන්නේය.

(ආ) විධායක සභාවේදී නව නිලධාරී මණ්ඩල තෝරා පත්කර ගැනීමෙන් අනතුරුව මෙම ව්‍යවස්ථාවෙහි දැක්වෙන නෛතික බලය ඒ ඒ නිලධාරීන්ට සහ මණ්ඩල ආදීයට පැවරෙන්නේය. එතෙක් මෙම අන්තර් විධිවිධාන බලාත්මක වන්නේය.

## 34 වන වගන්තිය
### ව්‍යවස්ථා සංශෝධනය

(අ) පක්ෂයේ මෙම ව්‍යවස්ථාව අනු සංවිධාන අනුබද්ධ සංවිධාන හෝ වෘත්තීය සමිති ව්‍යවස්ථා සංශෝධන කිරීමේ අවසන් බලය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වන්නේය. එවැනි ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් ඉදිරිපත්ව ඇති අවස්ථාවකදී ඒවා පළමුව සමස්ත ලංකා කාරක සභාවේත් දෙවනුව විධායක සභාවේත් යෝජනා ස්ථිරත්වයෙන් දේශපාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එම යෝජනාවල සුදුසු නුසුදුසුකම් දේශපාලන මණ්ඩලය විසින් සලකා බලා බහුතර කැමැත්තෙන් සම්මතකර ගත යුතුය.

**(ආ) කෙසේවූවද විධායක සභාවේ සහ දේශපාලන මණ්ඩලයේ ඒකාබද්ධ රැස්වීමකදී ව්‍යවස්ථාවේ සංශෝධනයක් කිරීමට බලය ඇති අතර එම ව්‍යවස්ථා සංශෝධනය ඉන් අනතුරුව කැඳවනු ලබන පළමු සමස්ත ලංකා කාරක සභා රැස්වීමට ඉදිරිපත් කොට අනුමැතිය ගතයුතු ය. එසේ ඊළඟ සමස්ත ලංකා කාරක සභාව කැඳවන තෙක් එම සංශෝධන බලාත්මක සංශෝධන ලෙස සැලකිය යුත්තේ ය.**

(ඇ) කිසියම් නව ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එනු ලබන අවස්ථාවකදී පැරණි සාමාජිකයන් කිසිදු වෙනසකින් තොරව නව සංශෝධනය යටතේද මෙම පක්ෂයෙහි සාමාජිකයින් ලෙස සලකනු ලැබිය යුත්තේය.

## 35 වන වගන්තිය

### ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීමේ බලය

(අ) මෙම ව්‍යවස්ථාවට අදාළව යම් ගැටලුකාරී අවස්ථාවක් පැන නැඟුණු විට හෝ කිසියම් වගන්තියක හෝ වගන්තිවල නිශ්චිත අර්ථය පිළිබඳව ගැටලුකාරීත්වයක් මතු වූ විටක ඒ පිළිබඳව අර්ථ නිරූපණය කිරීමට හෝ තීරණයක් ඉදිරිපත් කිරීමේ පූර්ණ සහ අවසන් බලය ඇත්තේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි දේශපාලන මණ්ඩලයටය.


(ආ) මෙම ව්‍යවස්ථාව පරිවර්තනය කිරීමේදී ඇතිවිය හැකි වූ භාෂාමය හෝ තාක්ෂණික දෝෂයක් ඇත්නම් එහි නිවැරදි පිටපත ලෙස සැලකිය යුත්තේ ව්‍යවස්ථාවේ සිංහල පිටපත වන්නේය.

**36 වගන්තිය**

**ව්‍යවස්ථාවට අදාළ ඇමුණුම්**

ඇමුණුම 01

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මැතිවරණ සලකුණ




ඇමුණුම 02

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ධජය/ පතාකය




ධජය




පතාකය

ඇමුණුම 03

## ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි ගීතය

"ඉරෙන් සඳවත එළි දැල්වේ
සඳෙන් රැය සඬාදුර නිමවේ
ඔබෙන් පෙරමුණ එළි දැල්වේ
එයින් ජන සඬාදුර නිමවේ

අරමුණ ඔබ - පෙරමුණ අප
කාගෙත් රට - සනසනු මැන

ජය සංඛා දිවි දී හඬවන
ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ..../

රුහිරු පුදා යුග යුග විරුවන් රැකි
සොඳුරු සඳ තන ජන පවුරෙන් සැදි
ඉසුරු සද ලක් මව, දරුවන් බැඳි
රුසිරු විද හල ජන රන්දම අපි

ජය සංඛා දිවි දී හඬවන
ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ..../

අහසේ ඉර හඳ පොදු නම් සැමදා
පොළවේ හඬ පොදු නම් අප අසනා
මහිමේ පිරි පොදු ජන සෙත උදෙසා
උරුමේ රකිනට එනුමැන නොලසා

ජය සංඛා දිවි දී හඬවන
ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ..../